වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

2022



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර

மாவட்ட செயலகம் - கண்டி

District Secretariat – Kandy

මහනුවර දිස්ත්‍රික් ලේකම්තුමාගේ / දිසාපතිතුමාගේ පණිවුඩය...



දිස්ත්‍රික් පරිපාලනයේ ඉහළම පාලන මධ්‍යස්ථානය වන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයි. ශ්‍රීලංකාවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 අතරින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හිමිවන්නේ සුවිශේෂීස්ථානයකි. ශ්‍රී දන්ත ධාතූන් වැඩ වසන කන්ද උඩරට ඓතිහාසික නගරයක් ලෙසද ලෝක උරුම නගරයක් ලෙස දෙස් විදෙස් සියළු දෙනාගේගෞරවාදරයටපත් වී ඇති අතරසංස්කෘතික උරුමය ප්‍රෞඩඉතිහාසය සහ ස්වාභාවික පරිසරය එය තව දුරටත් තීව්‍ර කිරීමට සමත් වී ඇත.

මහනුවර දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර් 1,940 ක වපසරියකින් යුක්ත වන අතර ජනගහණය1,499,168කි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක් ද ග්‍රාම නිලධාරී කොට්ඨාස 1,188 ක් ද ගම් 2,588 කින්ද යුක්ත වේ.

ග්‍රාමීය මට්ටමේ සිට දිස්ත්‍රික් මට්ටම දක්වා සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට පුළුල් දායකත්වයක් ලබාදෙමින් 2020 සහ 21 වසර තුළ පැවති කොවිඩ් 19 වසංගත රෝග තත්වය හා ආර්ථික අර්බුදකාරී තත්වය මතසාමාන්‍ය ජන ජීවිතයේ එතෙක් පැවති සමබරතාවය බිඳියාම හේතුවෙන් ඇති වූ සාමාන්‍ය ජනතාවගේ කායික මානසික විඩාව සමනය කිරීමට උපාය මාර්ගහා සැලසුම් ක්‍රියාත්මක කිරීමට සිදු විය.ජනතාවට වඩාත් සමීප සුභදශීලී රාජ්‍ය සේවයක් පවත්වා ගැනීමේ අරමුණින්අප සතු මානව සම්පත මනාව සංවර්ධනය කරගනිමින් පාරිභෝගික සත්කාරයට උචිත ආයතනික පරිසරයක් නිර්මාණයකිරීමට කටයුතු කළ අතර සමස්ත ජන ජීවිතය ද මදක් හෝ යථා තත්වයට පත් කිරීමට හැකි වීම අප ලැබූ විශේෂ ජයග්‍රහණයකි.

එමෙන්ම මහනුවර දිස්ත්‍රික් පරිපාලනයේ සිට ග්‍රාමීය මට්ටම දක්වා සමස්ත යාන්ත්‍රණයම පිළිබිඹු කරන්නාවූ 2022 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව මෙසේ එළි දැක්වීමට කැපවුණු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20ක නිලධාරීන් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරී මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

චන්දන තෙන්නකෝන්
දිසාපති / දිස්ත්‍රික් ලේකම් මහනුවර සහ
අතිරේක ලේකම්
රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පරිපාලන සිතියම - මහනුවරදිස්ත්‍රික්කය





මූලික තොරතුරු



පළාත	මධ්‍යම
දිස්ත්‍රික්කය	මහනුවර
වර්ග ප්‍රමාණය (ව.කි.මී.)	1,940
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව	20
ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව	1,188
ගම් සංඛ්‍යාව	2,588
ඡන්ද ප්‍රදේශ සංඛ්‍යාව	13
මහා නගර සභා සංඛ්‍යාව	01
නගර සභා සංඛ්‍යාව	04
ප්‍රාදේශීය සභා සංඛ්‍යාව	17
අධ්‍යාපන කලාප සංඛ්‍යාව	06
පාසැල් සංඛ්‍යාව	651
ගුරුවරු සංඛ්‍යාව	17,782
ශිෂ්‍ය සංඛ්‍යාව	274,557
රෝහල් (මහ/ශික්ෂණ/දිස්ත්‍රික්/ග්‍රාමීය) සංඛ්‍යාව	56
ආයුර්වේද මධ්‍යස්ථාන සංඛ්‍යාව	16
ඡන්ද දායකයින් සංඛ්‍යාව(2022 ඡන්දහිමි නාම ලේඛනය අනුව)	1,168,697
ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව	12
ගරු පළාත් සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව(මහනුවර දිස්ත්‍රික්කය)	58
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සංචාරක නිවාස සංඛ්‍යාව	01
මුළු ජනගහනය (2022 වසර අනුව)	1,499,168
ස්ත්‍රී (2020)	775,951
පුරුෂ (2020)	707,154
ගෘහ ඒකකගණන	348,019
නිවාස ඒකක ගණන	342,911

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය ,මහනුවර
මැතිවරණ කාර්යාලය - මහනුවර දිස්ත්‍රික්කය, වෛද්‍ය දත්ත ඒකකය

පෙළගැස්ම

අනු අංකය				විස්තරය	පිටු අංකය
1				හැඳින්වීම	1
	1	2		දැක්ම,අගයන් හා මෙහෙවර	7
	1	2	1	තත්ත්ව ප්‍රතිපත්තිය	8
	1	3		දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්	9
	1	4		සංවිධාන සටහන	11
	1	5	1	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අංශ	12
	1	5	2	ප්‍රාදේශීය ලේකම් කාර්යාල	12
2				ප්‍රගතිය හා ඉදිරි දැක්ම	
	2	1		විශේෂ අවස්ථා	13
	2	2		ජයග්‍රහණ, අභියෝගහා ඉදිරි ඉලක්ක	19
3				සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	
	3	1		මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	23
	3	2		මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය	24
	3	3		මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	25
	3	4		මූල්‍ය ප්‍රකාශ සටහන්	26
	3	5		ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	52
	3	6		වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	52
	3	7		මු.රෙ. 208 ප්‍රකාරව ප්‍රදානය කරනු ලබන ප්‍රතිපාදන	53
	3	8		මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	59
	3	9		විගණකාධිපතිවරයාගේ වාර්තාව	62
4				කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරි සැලැස්මට අනුව)	
	4	1	1	ක්‍රමසම්පාදන අංශය	72
	4	1	2	ඉංජිනේරු අංශය	72
	4	1	3	ගිණුම් අංශය	72

	4	1	4	අභ්‍යන්තර විගණන අංශය	73
	4	1	5	සංවර්ධන අංශය	74
	4	1	6	ඉඩම් අංශය	74
	4	1	7	ජන හා සංඛ්‍යා ලේඛන අංශය	75
	4	1	8	දිස්ත්‍රික් ආපදා කළමණාකරණ අංශය	76
	4	1	9	දිස්ත්‍රික් ඉඩම් පරිහරණ අංශය	76
	4	1	10	ආගමික කටයුතු අංශය (බෞද්ධ)	77
	4	1	11	ආගමික කටයුතු අංශය (හින්දු)	77
	4	1	12	ආගමික කටයුතු අංශය (ක්‍රිස්තියානි)	77
	4	1	13	ආගමික කටයුතු අංශය (මුස්ලිම්)	78
	4	1	14	සංස්කෘතික අංශය	78
	4	1	15	ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා අංශය	79
	4	1	16	කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය	80
	4	1	17	මිනුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය	80
	4	1	18	පාරිභෝගික සේවා අංශය	80
	4	1	19	දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය)	81
	4	1	20	දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (මුල් ළමාවිය සංවර්ධන)	81
	4	1	21	දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (ජාතික ළමාරක්ෂක අධිකාරිය)	82
	4	1	22	දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි)	82
	4	1	23	මානව සම්පත් අංශය	83
	4	1	24	විදේශ රැකියා කටයුතු අංශය	83
	4	1	25	ආයතන අංශය	84
	4	1	26	ඵලදායිතා අංශය	86
	4	1	27	දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය	86
	4	1	28	සමෘද්ධි අංශය	87
	4	1	29	ජලජීවී අංශය	90
	4	1	30	දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය	91
	4	1	31	සමාජ ආරක්ෂණ අංශය	92

	4	1	32	සමාජ සේවා අංශය	92
	4	1	33	සමාජ සේවා (වැඩිහිටි ප්‍රවර්ධන)	93
	4	1	34	සමාජ සේවා (උපදේශණ)	94
	4	1	35	ව්‍යවසාය සංවර්ධන අංශය	94
	4	1	36	ක්‍රීඩා අංශය	95
	4	1	37	රාජ්‍ය නොවන සංවිධාන අංශය / ක්ෂුද්‍ර මූල්‍ය	95
	4	1	38	මෝටර් රථ අංශය	96
	4	1	39	අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය	96
	4	1	40	දිස්ත්‍රික් සමඵ නිලධාරි	96
	4	1	41	දිස්ත්‍රික් විද්‍යා ඒකකය	97
	4	1	42	ජාතික පොහොර ලේකම් කාර්යාලය	97
5				තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම	
	5	1		හඳුනා ගන්නා ලද අදාළතිරසාර සංවර්ධන අරමුණු	98
	5	2		තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්	98
6				මානව සම්පත් පැතිකඩ	
	6	1		සේවක සංඛ්‍යා කළමනාකරණය	103
	6	2		මානව සම්පත පිළිබඳව ආයතනයේ කාර්ය සාධනය	104
	6	3		මානව සම්පත් සංවර්ධනය	104
7				අනුකූලතා වාර්තාව	106

හැඳින්වීම

1.මහනුවර දිස්ත්‍රික්කය හැඳින්වීම

මනහර කඳුවැටි හා නිම්න භූමිවලින් සැදුම්ලත් මහනුවර දිස්ත්‍රික්කය මධ්‍යම කඳුකරයේ වර්ගකිලෝමීටර් 1,940 ක භූමි ප්‍රමාණයක් වසා පැතිරී ඇති මනරම් භූමි භාගයකි.උතුරින් මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල, රත්තොට, ලග්ගල-පල්ලේගම හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ද, නැගෙනහිරින් බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, දකුණින් බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, හඟුරන්කෙත, කොත්මලේ, නුවරඑළිය හා අඹගමුව කෝරළේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් ද, බටහිරින් කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක,බුලත්කොහුපිටිය, මාවනැල්ල හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් මායිම් වී පවතින මහනුවර දිස්ත්‍රික්කය, උතුරු අක්ෂාංශ 60.560 ත් 70.290ත් හා නැගෙනහිර දේශාංශ 80.250 ත් 80.000ත් අතර පිහිටා ඇත.

මහනුවර දිස්ත්‍රික්කයේ වැඩි භූමි ප්‍රදේශයක් ස්පර්ශ කරමින් ගලා යන මහවැලි ගංගාව දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශවලින් ගලා එන ජලධාරාවන්ගෙන් පෝෂණය වේ. මීට අමතරව දැදුරු ඔයේ ආරම්භක ජලධාරා පෝෂණය වන්නේද පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි.මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල බටහිර බෑවුමෙන් ගලා යන ජලධාරා මා ඔයට එක් වී එහි ධාරිතාවය වැඩි කරයි.

ඓතිහාසික පසුබිම

අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන මහනුවර, අනුරාධපුර හා පොළොන්නරු යුගයන්වලදී මලය රට ප්‍රදේශයට අයත්ව තිබූ අතර ගම්පොළ රජ කළ තුන්වන වික්‍රමබාහු රජ දවස නගරයක් වශයෙන් දියුණු කළ බව ජනප්‍රවාදයේ දැක්වේ. සෙංකඩගල නුවර නමින් එදා හැඳින්වූ මහනුවර පළමු වන විමලධර්මසූරිය රජතුමා විසින් සිංහල රාජධානියේ අග නගරය ලෙස යොදා ගනිමින් අලංකාර දළදා මන්දිරයක්, රජ මාළිගයක් ඇතුළු සියලුම අංගවලින් සම්පූර්ණ නගරයක් බවට පත් කරන ලදි. එතැන් සිට සියවස් තුනක පමණ කාලයක් පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන බටහිර බලවත් ජාතීන්ගෙන් නිර්මල බුදු දහම හා සිංහල සංස්කෘතිය ආරක්ෂාකර ගනිමින් 1815 මාර්තු 02 වන දින දක්වා සිංහල රාජධානියේ අගනුවර වශයෙන් සෙංකඩගල පුරවරය නොසැලී පැවතුනි. මුහුදුබඩ පළාත් බටහිර ජාතීන් පාලනය කළ යුගයේ දී ඔවුන් විසින් මහනුවර රාජධානියට වරින් වර එල්ල කෙරුන ආක්‍රමණයන්ට එරෙහිව සිදු වූ ජයග්‍රාහී සටන් බොහෝමයක් මහනුවර ආශ්‍රිතව සිදු විය. දෙවන රාජසිංහ රජ සමයේ පේරාදෙණිය, ගන්නෝරුවේ දී සහ යටිනුවර දන්තුරේ දී සිදු වූ සටන්වලින් ආක්‍රමණික විදේශ හමුදා සම්පූර්ණයෙන්ම විනාශයට පත් විය. විදේශිකයන්ගෙන් සිංහල රාජධානිය රැක ගැනීමට පිහිට වූ ප්‍රධාන බල කොටුවක් වන බලන කොටුව වර්තමාන කඩුගන්නාව නගරය ආසන්නයේ පිහිටා ඇත.

1815 දී විවිධ දේශපාලන අර්බුද නිසා මහනුවර රාජධානිය බ්‍රිතාන්‍ය ජාතිකයන්ට අයත් වූ පසු අවසන් සිංහල රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු එම වසරේ පෙබරවාරි 15 වන දින මැදමහනුවර බෝමුරේ ගම්මානයේ දී ඉංග්‍රීසින් විසින් අල්ලා ගන්නා ලදි. 1815 මාර්තු මස 02 වන දින මහනුවර මහල් මඩුවේ දී අත්සන් තැබුණු උඩරට ගිවිසුම මඟින් ශ්‍රී ලංකාවේ පාලනය ඉංග්‍රීසින් අතට පත් වූ අතර ඔවුන් විසින් රටේ අග නගරය ලෙස කොළඹ භාවිතා කරන තෙක්ම රටේ ප්‍රධාන නගරය ලෙස සැලකුනේ මහනුවරයි.සිංහල ඉතිහාසයේ අවසන් නිදහස් සටන වන 1818 දී ඌව - වෙල්ලස්ස කැරැල්ල වෙනුවෙන් මහනුවර ප්‍රදේශයේ රදළ නායකයින් විශාල පිරිසක්

නායකත්වය දී ඇත. සිය තනතුරු පසෙකලා නිදහස් සටන වෙනුවෙන් කැපවුනු මොණරවිල, කැප්පෙටිපොළ,මඩුගල්ල ආදී නායකයන් බොහෝ දෙනෙකුගේ නිජ බිම වී ඇත්තේ මහනුවරප්‍රදේශයයි.1818 නිදහස් අරගලය කෲර ලෙස මැඩපැවැත් වූ ඉංග්‍රීසින් විසින් මහනුවර ප්‍රදේශය ඇතුළු කඳුකරය වැවිලි කර්මාන්තය හා වෙළඳාම මත පදනම් වූ ආර්ථික රටාවක් කරා ගෙන යන ලදි. වැවිලි ආර්ථිකය යටතේ මුලින්ම හඳුන්වා දුන් කෝපි වගාව දිලීර රෝගයක් නිසා විනාශ වූ පසු දිවයිනේ සිටුවන ලද පළමු තේ ගස දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලූල්කඳුර වතු යායේ අදත් දක්නට ඇත.

ඓතිහාසික ස්ථාන

මුළු මහත් ලෝකයේම බෞද්ධ ජනතාව අතර ගෞරවයට පාත්‍ර වූ ඓතිහාසික වශයෙන් වැදගත් වූ සිද්ධස්ථාන විශාල ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

1. දළදා මාලිගාව
2. ගඩලාදෙණිය විහාරය
3. ඇම්බැක්ක දේවාලය
4. දෙගල්දොරුව රජමහා විහාරය
5. ගල්මඩුව රජමහා විහාරය
6. තලාව රජමහා විහාරය

දේශගුණික හා පාරිසරික ලක්ෂණ

මධ්‍යම කඳුකරය ප්‍රධාන වශයෙන් මුහුදු මට්ටමේ සිට මීටර් 100 -1,600 ත් අතර උසකින් යුක්තව පිහිටා ඇත. එසේ වුවද මහනුවර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය, මහවැලි ගඟට මායිම්ව මුහුදු මට්ටමේ සිට මීටර් 100 ක පමණ උසින් යුතුව තැනිතලා ස්වභාවයක් ගනී. සාමාන්‍යමාසික වර්ෂාපතනය මි.මී. 212ක අගයක් ගන්නා අතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය වන මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කඳුකර හා පහතරට වියළි කලාපීය දේශගුණික ලක්ෂණයන් සහිතය.

දිස්ත්‍රික්කයේ මාසික වර්ෂාපතනය - 2019- 2020

මාසය	වර්ෂාපතනය 2019 (මිලි මීටර්)	වර්ෂාපතනය 2020 (මිලි මීටර්)
ජනවාරි	3.60	23.0
පෙබරවාරි	55.10	3.08
මාර්තු	20.00	56.09
අප්‍රේල්	222.90	107.02
මැයි	17.90	316.09
ජූනි	82.00	129.05
ජූලි	96.80	115.05
අගෝස්තු	165.80	142.02
සැප්තැම්බර්	101.01	219.01
ඔක්තෝබර්	288.02	59.05
නොවැම්බර්	197.04	160.09
දෙසැම්බර්	106.01	189.03

මූලාශ්‍රය - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 20-22 අතර අගයක් ගන්නා අතර වසර පුරාම සෞම්‍යාදේශගුණයක් දිස්ත්‍රික්කයේ වැඩි භූමි ප්‍රදේශයක පවතී. සාමාන්‍යයෙන් දෙල්තොට, පස්බාගේ කෝරළේ,ගහතුහළ කෝරළේ, උඩදුම්බර, පන්විල ආදී ප්‍රදේශ උෂ්ණත්වයෙන් සාපේක්ෂව අඩු අගයක් ගන්නා අතර ප්‍රධාන වශයෙන් වියළි කලාපයේ පිහිටා ඇති මිනිපේ ප්‍රදේශය සාපේක්ෂව වැඩි උෂ්ණත්වයකින් යුක්තය.

දිස්ත්‍රික්කයේ මාසික උපරිම හා අවම උෂ්ණත්වය -2019 - 2020

අනු අංකය	මාසය	උෂ්ණත්වය 2019 (සෙල්සියස් අංශක)		උෂ්ණත්වය 2020 (සෙල්සියස් අංශක)	
		උපරිම	උපරිම	අවම	අවම
1	ජනවාරි	29.8	na	30.7	19.8
2	පෙබරවාරි	31.0	20.6	31.4	20.3
3	මාර්තු	33.2	21.5	33.6	na
4	අප්‍රේල්	32.4	21.5	33.1	21.7
5	මැයි	31.7	22.2	30.7	22.8
6	ජූනි	29.9	21.3	29.5	21.8
7	ජූලි	29.8	21.7	29.4	21.7
8	අගෝස්තු	28.5	na	29.2	21.3
9	සැප්තැම්බර්	29.1	na	28.0	21.6
10	ඔක්තෝබර්	29.0	21.1	29.2	21.3
11	නොවැම්බර්	30.0	21.1	30.1	21.4
12	දෙසැම්බර්	28.5	20.7	28.5	20.3

මූලාශ්‍රය- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තමේන්තුව

මහවැලි ගංගාව දිස්ත්‍රික්කය මැදින් ගලා යන ප්‍රධාන ගංගාව වන අතර එය මුළු දුරෙන් ආසන්න වශයෙන් කි.මී. 110 ක දුරක් මහනුවර දිස්ත්‍රික්කය ආශ්‍රිතව ගලා බසී. මහවැලි ගංගාවේ ආරම්භක ජල ධාරා වන හැටන් ඔය සහ කොත්මලේ ඔය එක් වී මහවැලි ගංගාව නමින් ගලා බැසීම පටන් ගන්නේ ද පස්බාගේ කෝරළේ පොල්වතුර නම් ග්‍රාමයේ දී ය. එමෙන්ම මහවැලි කලාපයේ ප්‍රධාන කඳු ශිඛරය වන කොබෝනීල ගල(උස මීටර් 1,553.87), දෝතළුගල(උස මීටර් 1,642.57) ආදී කඳුවැටි මහනුවරදිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත.සාමාන්‍ය වර්ෂාපතනය ඉහළ අගයක් ගන්නා මෙම කලාපය මහවැලි ගඟේ සහ අඹන් ගඟේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශයක් වේ. ශ්‍රී ලංකාවට ආවේණික ශාක සහ සත්ත්ව ප්‍රජාවට රැකවරණය සලසන නකල්ස් කඳුවැටිය දිස්ත්‍රික්කයේ ස්වභාව සෞන්දර්යය අතින් ඉහළම තැනක් ගන්නා ප්‍රදේශයකි.

හන්තාන කඳුවැටිය, අම්බුළුවාව කන්ද, බලන කඳුවැටිය, අලගල්ල කන්ද වැනි කඳු ප්‍රදේශ මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර කඩියන්ලෙන, ගලබොඩ ආදී සුන්දර දිය ඇළි විශාල ප්‍රමාණයක් ද මහනුවර

දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මේ දිය ඇළිවලින් විශාල ප්‍රමාණයක් අප්‍රකටව පවතින මුත් සුන්දරත්වය අතින් ඉහළ අගයක් ගනී.

ස්වභාවික වෘක්ෂලතා

මහනුවර දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 194,000ක් වේ. දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 21% ක් එනම් හෙක්ටයාර 41,521 ක් වනාන්තර වශයෙන් පවතී. දැඩි රක්ෂිතයන් ලෙස රැක ගත යුතු මෙම වනාන්තරවලින් හෙක්ටයාර 23,317 භූමි ප්‍රමාණයක් ඝන වනාන්තර වශයෙන් ද හෙක්ටයාර 10,759 ක් විවෘතවනාන්තර සහ හෙක්ටයාර 7,445 ක ප්‍රමාණයක් වන වගා ලෙස ද පවතී.උස් කඳු මුදුන් ආශ්‍රිතව ද වැඩි වනගහනයක් දක්නට ඇත. මේ හේතුවෙන් ප්‍රදේශයේ ජල උල්පත්වල පැවැත්ම සඳහා මෙම වනාන්තර ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම දැඩි අවශ්‍යතාවක් වන අතර විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙහි පැවැත්මට තර්ජන එල්ලවන අවස්ථා ඇත.

නකල්ස් රක්ෂිතයට අයත් වන ප්‍රදේශයෙන් විශාල භූමි ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයට අයත් වේ. ශ්‍රී ලංකාවට ආවේණික ශාක හා සත්ත්ව වර්ග කීපයකට වාසභූමිය වන මෙම කලාපය දැඩි ස්වභාවික රක්ෂිතයක් ලෙස නම් කර ඇත. හන්තාන කඳුවැටිය, වාකරවත්ත කැලේහා උඩවත්ත කැලේ මහනුවර නගරාසන්නයේ පිහිටා ඇත. හන්තාන කඳුවැටිය දැඩි පාරිසරික තර්ජනයකට ලක් වූ ප්‍රදේශයකි.

වන සතුන්

මහනුවර දිස්ත්‍රික්කයේ වනාන්තර ආශ්‍රිතව විශාල වන සත්ත්ව ප්‍රජාවක් ජීවත් වන අතර අලියා, දිවියා, වඳුරා, වල් ඌරා, කොළ දිවියා, මුවා, වැලි මුවා ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

උඩදුම්බර, මිනිපේ යන ප්‍රදේශවල වල් අලින් දක්නට ඇති අතර රන්දෙණිගල අභය භූමිය හා උඩදුම්බර මීමුරේ ප්‍රදේශ ආශ්‍රිතව නිරන්තරයෙන් වල් අලි සැරිසරති. මෙම ප්‍රදේශවල විශාල ලෙස පැතිරුණු වනගහනය තුල දිවියන් ද ජීවත් වන අතර ගම්පොළ, හන්තාන, පාතහේවාහැට යන ප්‍රදේශවලින් ද දිවියන් පිළිබඳව විටින් විට වාර්තා වේ. දිස්ත්‍රික්කයේ සෑම ප්‍රදේශයකම කැලෑ ආශ්‍රිතව වඳුරන්, රිලවුන් සහ වල් ඌරන් ජීවත් වන අතර රන්දෙණිගල අභයභූමිය ආශ්‍රිතව තිත් මුවන්, ගෝනුන් සහ වැලි මුවන් වැනි සත්ත්ව විශේෂ දක්නට ඇත. මීට අමතරව පක්ෂි විශේෂයන් ද සැළකිය යුතු ප්‍රමාණයක් ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වේ.

ජීවන රටාව

මහනුවර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 1,499168 වන අතර මෙහි නාගරික, ග්‍රාමීය හා වතු යන අංශ තුනම නියෝජනය කරන ජනගහන රටාවක්ද දක්නට ලැබේ. දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් 185,893 (12.4% ක්) නාගරික අංශයද,1,219,952 (81.4% ක්) ග්‍රාමීය අංශයද, 93,323 (6.2%ක්) වතු අංශයද නියෝජනය කෙරේ.

සමස්තයක් වශයෙන් ගත් කළ මහනුවර දිස්ත්‍රික්කය තුළ කෘෂිකාර්මික ආර්ථික රටාවක් දැකිය හැකිය. ඉඩම් පරිහරණ රටාව දෙස බලන විට අස්වද්දන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 35,628 ක් වේ. එසේම තේ, පොල්, රබර්, කුරුඳු හා වෙනත් වගාවන් පිළිවෙලින් හෙක්ටයාර 21,283, 10,911, 2,255, හා 12,118 ක් වේ.

12% ක් පමණ වන නාගරික ප්‍රදේශවල අධික ජන ඝනත්වයක් දක්නට ලැබෙන අතර ඔවුන් කර්මාන්ත හා සේවා ක්ෂේත්‍ර යටතේ තම ජීවන වෘත්තීන්වල නිරත වීමක් දක්නට ලැබේ. ඒ අනුව මෙම ක්ෂේත්‍රයන් ඔස්සේ නාගරික ජනතාව දිස්ත්‍රික්කයේ ආර්ථිකයට දක්වන දායකත්වය සුවිශේෂී වේ.

වාරිමාර්ග පද්ධතිය

මහනුවර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග පද්ධතිය දෙස බැලීමේදී මිනිපේ ව්‍යාපාරය, මුරපොළ ඇළ ව්‍යාපාරය, ගම්පොළවෙල ව්‍යාපාරය, උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරය ප්‍රධානතම වාරිමාර්ග පද්ධති ලෙස හඳුන්වා දිය හැක.

මහනුවර දිස්ත්‍රික්කයට අයත් එකම ගොවි ජනපදය වශයෙන් මිනිපේ ව්‍යාපාරය හැඳින්විය හැකි අතර පළමුවැනි අග්බෝ රජ සමය දක්වා ඇත අතීතයකට නැකම් කියන මිනිපේ ජනපදය මහා වටිනා සම්පතකි.

මෙම ජනපදය 1931 වර්ෂයේදී මහාමාන්‍ය ඩී.එස් සේනානායක මහතා විසින් ආරම්භ කරන ලදී.මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පවතින මෙම ව්‍යාපාරයේ ජල මූලාශ්‍රය වන්නේ මහවැලි ගඟය. මෙහි ප්‍රධාන ඇළ මාර්ගය මිනිපේ වම් ඉවුර වන අතර එහි දිග ප්‍රමාණය කි.මී.74 කි. එසේම බෙදුම් ඇළවල් 1,556 කින් හා කෙත් ඇළවල් 491 කින් සමන්විත මිනිපේ ව්‍යාපාරයේ මුළු වගා වපසරිය අක්කර 18,595ක් වේ. වගා ප්‍රභේදයන් ලෙස වී හා අතිරේක බෝග වගාව හඳුන්වා දිය හැකි අතර වගා ප්‍රභේදයෙන් 80%ක් වී වගාව වන අතර ඉතිරි 20% අතිරේක බෝග වගාව වේ.

මුරපොළ ඇළ ව්‍යාපාරය මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට හා පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02 ට අයත්ව පවතින අතර ප්‍රධාන ඇළේ දිග කි.මී.15.5 කි. මෙහි වගා වපසරිය අක්කර 1,200 ක් වන අතර, වී හා අතිරේක බෝග වගා ප්‍රභේද ලෙස පෙන්වා දිය හැක.මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 2,600 කි.

පාතදුම්බර, පන්විල හා කුණ්ඩසාලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පවතින උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරයේ ජල මූලාශ්‍රය රවන් ඔය වන අතර ප්‍රධාන ඇළේ දිග කි.මී.7.1 කි. මෙහි වගා වපසරිය අක්කර 405 ක් වන අතර වී හා එළවළු බෝග ප්‍රධාන වේ. උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරය මඟින් පවුල් 1,000 ක් ප්‍රතිලාභ ලබයි.

උලපනේ ඔය ජල මූලාශ්‍රය කොටගත් ගම්පොළවෙල රජ ඇළ ව්‍යාපාරය ගහඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත. මෙහි ප්‍රධාන ඇළේ දිග කි.මී.12.8 ක් වන අතර වගා කරන බිම් ප්‍රමාණය අක්කර 405 කි. මෙමඟින් ප්‍රතිලාභ ලබන පවුල් ප්‍රමාණය 1,000 කි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැඳින්වීම

මධ්‍යම පළාතේ ප්‍රධානතම දිස්ත්‍රික්කය වන මහනුවර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20කින් ද, පළාත් පාලන බලප්‍රදේශ 22කින් ද, ග්‍රාම නිලධාරී වසම්1,188කින් ද සමන්විත වන මහනුවර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 1,499168. මුළු ජනගහනයෙන් 74.4% ක් සිංහල ද, 11.2%ක් ද්‍රවිඩ ද, 13.9% ක්මුස්ලිම් ද, 0.5% ක් වෙනත් ජාතීන්ගෙන් ද සංයුක්ත වේ.

විටින් විට විවිධ විදේශීය ආක්‍රමණවලට ලක්වූව ද කන්ද උඩරට රාජධානිය ස්වාධීනව පැවති නමුදු වර්ෂ 1815 මාර්තු දෙවෙනිදා අත්සන් කරන ලද උඩරට ගිවිසුමත් සමඟම එහි ස්වාධීනත්වයද බිඳී යමින් සමස්ත ලක්දිවම බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කන්ද උඩරට පැවති රජු මුල් කර ගත් දේශීය රාජ්‍ය පරිපාලන ව්‍යුහය මුළුමනින්ම බිඳ වැටුණු අතර බ්‍රිතාන්‍ය අණසකට යටත් පරිපාලන රටාවක් බිහි විය. ඒ අනුව බ්‍රිතාන්‍ය යුගයේ මධ්‍යම පළාතේම ප්‍රධාන පරිපාලන නිලධාරියාමහනුවර කච්චේරියේ දිසාපතිවරයා විය. ඉතිහාසගත තොරතුරු මූලාශ්‍ර වලට අනුව මහනුවර කච්චේරිය ක්‍රි.ව. 1825 දී මහනුවර රජගෙදර කේන්ද්‍ර කොටගෙන ආරම්භ කොටඇත. මහනුවර ප්‍රථම දිසාපතිවරයා ලෙස සුදු ජාතික ජෝර්ජ් ටර්නර් මහතා 1825 සිට 1837 දක්වා කාලය තුළ කටයුතු කොට ඇත.

මහනුවර රජගෙදර කේන්ද්‍ර කොටගෙන පවත්වාගෙන යනු ලැබූ මහනුවර කච්චේරිය 1868 දී ශ්‍රී දළදා මාළිගාවේ පත්තිරිප්පුව වෙත රැගෙන ගොස් ඇති බවටදතොරතුරුහමුවෙයි. එවකට මහනුවර සමයේ දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ පී.ඩබ්. බෙබaaක් මහතාය.

පසු කාලීනව විවිධ හේතූන් මත මහනුවර කච්චේරිය මහනුවර තැපැල් කාර්යාලගොඩනැගිල්ලට තාවකාලිකව ගෙන ගොස් ඇත. පසුව 1880 දී ශ්‍රී දළදා මාළිගාවට සමීපව ඉදිකළගොඩනැගිල්ලට (පසු කාලීනව උසාවි ගොඩනැගිල්ල) ගෙන ගොස් ඇති අතර එවකට දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ එෆ්.බී.ටෙම්ප්ලර් මහතාය. එවක් පටන් අවුරුදු 80 ක් පමණ රාජකාරී කටයුතු අඛණ්ඩව සිදු වී ඇත්තේ එම ස්ථානයේය.

1957 වර්ෂයේ දී මහනුවර කච්චේරිය දැනට යටිනුවර වීදියේ පවත්නාගොඩනැගිල්ලට ගෙන ගොස් ඇති අතර එවකටදිසාපතිවරයාලෙස කටයුතු කර ඇත්තේ ඒ.බී.එස්.එන් පුල්ලෙයාර් මහතාය.1946 වර්ෂයේ සිට ලංකා සිවිල් සේවයේ නිලධාරීන් දිසාපතිවරුන් වශයෙන් සේවයකර ඇත. 2018 නොවැම්බර් මස 19 සිට 2020 සැප්තැම්බර් මස දක්වා විවිධ රාජ්‍ය ආයතන ගණනාවක සේවා අත්දැකීම් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වන ඩී.එම්.එන්.ජී.ජී.තිස්ස කරුණාරත්න මහතා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කල අතර වර්තමාන දිසාපතිවරයා වශයෙන් විවිධ රාජ්‍ය ආයතන ගණනාවක සේවා අත්දැකීම් සහිත චන්දන තෙන්නකෝන් මහතා 2020 සැප්තැම්බර් මස සිට මේ දක්වා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ අංශ 25 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇති අතර ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද, රජයේ විගණන කාර්යාලයද ,බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා මැතිවරණ දෙපාර්තමේන්තුවද මෙම ගොඩනැගිල්ල තුළම ස්ථාපිත කර ඇත.

1.2. දැක්ම,අගයන්,මෙහෙවර

දැක්ම

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම
පරිපාලන ආයතනය බවට පත් කිරීම.

අගයන්

- ආචාරශීලි සහ සුහදශීලි සේවය
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සැළකීම හා ගරු කිරීම
- ආබාධිත පුද්ගලයන්ට ප්‍රමුඛතාවය
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතුකිරීම
- පරිසර හිතකාමී කාර්යාල පරිසරයක්
- දැනුම කළමනාකරණ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම
- උපරිම පාරිභෝගික සත්කාරය මඟින් සේවා ලාභීන් අමන්දානන්දයට පත් කිරීම

මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව
දිස්ත්‍රික්කයට ආවේණික වූ
ප්‍රෞඪ උරුමයන් සුරකිමින්
මහනුවර දිස්ත්‍රික්කය
තිරසාර සංවර්ධනය කරා ගෙන යාම.

1.2.1තත්ත්ව ප්‍රතිපත්තිය



1.3.දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

➢ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය, අධීක්ෂණය හා එම නිලධාරින්ගේ ආයතන කටයුතු. (නිලධාරින්ගේ සේවය ස්ථීර කිරීම්, කඩඉම් පරීක්ෂණ පැවැත්වීම්, උසස් වීම්/සේවය දීර්ඝ කිරීම් හා නිලධාරින්ට වැටුප් ණය අත්තිකාරම් ලබා දීම් වැනි ආයතනික පහසුකම් සැලසීම)

➢ දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති වසම් 1,188 ක ග්‍රාම නිලධාරින්ට අදාළ වූ ආයතන රාජකාරි ඉටු කිරීමෙන් ඔවුන් තුළ යහපත් මානසික තෘප්තියක් ඇති කිරීම.

➢ ශ්‍රී දළදා මාළිගාව ප්‍රමුඛ මල්වතු අස්ගිරි මහා විහාර සහ අනෙකුත් බෞද්ධ විහාරස්ථාන කටයුතු, ශ්‍රී දළදා පෙරහැර සංවිධාන කටයුතු, දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ කටයුතු ඇතුළු බෞද්ධ ආගමික කටයුතු.

➢ හින්දු, ඉස්ලාම්, කතෝලික හා අනෙකුත් ආගම්වලට අදාළ කටයුතු.

➢ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව, දිස්ත්‍රික් නිවාස කමිටුව, දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුව, දිස්ත්‍රික් ආරක්ෂක/ආපදා කළමනාකරණ කමිටුව, දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටුව වැනි කමිටු පැවැත්වීමෙන් හා දිස්ත්‍රික් ලේකම් ප්‍රධානත්වයෙන් පැවැත්විය යුතු සියලු රැස්වීම් සංවිධානය කරමින් අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.

➢ ආර්ථික සංවර්ධන කටයුතු සහ ජලය, විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සමඟ දිස්ත්‍රික් ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

➢ මහනුවර නගරය හා දිස්ත්‍රික්කය විශේෂ වශයෙන් සළකා පවරනු ලබන ජාතික මට්ටමේ උත්සව හා විවිධ රාජ්‍ය උත්සව සංවිධානය කර පැවැත්වීම.

➢ මැතිවරණ දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික්කයේ මැතිවරණ කටයුතු මෙහෙයවීම.

➢ නවක රාජ්‍ය නිලධාරින් පුහුණු කිරීම හා දැනට සේවයේ නිරත රාජ්‍ය නිලධාරින්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම උදෙසා කාලීන අවශ්‍යතා මත පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම.

➢ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ව්‍යවස්ථාපිත හා සංවර්ධනාත්මක කාර්යයන් ප්‍රශස්ත ආකාරයෙන් ඉටු කරවීම සහ යහපත් මූල්‍ය පරිපාලනයක් ඇති කිරීම සඳහා කාර්යාල අධීක්ෂණ ක්‍රමවේදයක් ඇතිකර එය වර්ෂය පුරා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය මඟින් පරීක්ෂා කිරීම,නිවැරදි කරවීම් සහ මහපෙන්වීම් ලබාදීමට කටයුතු කිරීම.

➢ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්පත් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රමසම්පාදන කටයුතු ඉටු කිරීම.

➢ දිස්ත්‍රික්සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

➢ දිස්ත්‍රික්ලේකම්/දිසාපතිවරයාගේ අධීක්ෂණයේ පවතින කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, පාරිභෝගික අධිකාරිය, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය, සමාජ ආරක්ෂණ අංශය, දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය, සංඛ්‍යා ලේඛන අංශය, මෝටර් රථ ප්‍රවාහන, සංස්කෘතික හා බෞද්ධ කටයුතු, ආපදා කළමනාකරණ කටයුතු, දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය, ජාතික ජලජීවී වගා ව්‍යාප්ති අංශය, සමාජ සේවා අංශය,ඵලදායිතා අංශය, මානව සම්පත් හා වෘත්තීය මාර්ගෝපදේශන අංශය,ළමා හා කාන්තා කටයුතු, ක්‍රීඩා අංශය,කෘෂිකර්ම සහ සමෘද්ධි යන අංශ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.

➢ මහජනයාගෙන් ලැබෙන පැමිණිලි, පෙත්සම්, දුක් ගැනවිලි, ඉල්ලීම් යනාදිය සම්බන්ධව අදාළ අංශ වෙතින් තොරතුරු ලබා ගෙන විසඳුම් ලබාදීම හා දිස්ත්‍රික් පරිපාලනයට හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ නිලධාරීන් සම්බන්ධව ලැබෙන පෙත්සම්, පැමිණිලි සම්බන්ධව අපක්ෂපාති පරීක්ෂණ පැවැත්වීම තුළින් යහපත් පාලනයක් ඇති කිරීම.

➢ මහනුවර දිස්ත්‍රික්කය තුළ කොස්, දෙල් ගස් හෙළීම සඳහා ගස් සංඛ්‍යාව 03කට වඩා වැඩි 15කට වඩා අඩු අවස්ථාවන්වලදී බලපත්‍ර නිකුත් කිරීම අනුමත කිරීම සහ ගස් සංඛ්‍යාව 15 ට වඩා වැඩි අවස්ථාවන්වලදී කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ ලබා දීම.

➢ මහනුවර දිස්ත්‍රික්කය තුළ ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම, වාර්ෂිකව පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ලබා දීම.

➢ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේ කාර්යාල සඳහා ජල, විදුලි හා අභ්‍යන්තර දුරකතන පහසුකම් සැළසීම තුලින් මහජන සේවා සැපයීමට යටිතල පහසුකම් සැපයීම.

➢ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් අධීක්ෂණය වන කාර්යාලවල ආයතන කටයුතු ඉටු කිරීම.

➢ මහනුවර දිස්ත්‍රික්කයෙහි සිදු වන ස්වාභාවික සහ හදිසි ආපදාවන්වලදී පීඩාවට පත්වන ජනතාවට කඩිනම් සහන සැලසීම සඳහා අවශ්‍ය ක්ෂණිකපියවර ගැනීම සහ දිර්ඝ කාලීන විසඳුම් අවශ්‍ය වන අවස්ථාවන්වලදී අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය පියවර ගැනීම.

➢ දිස්ත්‍රික්කයෙහි කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සහ රජය විසින් ජනතාවට සහන සැලසීම උදෙසා වන කාර්යයන්කඩිනමින් ඉටු කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කිරීම.

➢ දිස්ත්‍රික් පරිපාලන විෂය පථය තුළ මහනුවර නගරයට හා මහනුවර දිස්ත්‍රික්කයට විශේෂිතව කාලීන පැවරෙන විශේෂ කාර්යයන් සංවිධානය,පරිපාලනය හා නියාමනය සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම

1.4.සංවිධාන ව්‍යුහය


මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - සංවිධාන ව්‍යුහය
දිස්ත්‍රික් ලේකම් /දිසාපති හා සිවඳේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්
අතිරේක දිස්ත්‍රික් ලේකම්
ප්‍රධාන ගණකාධිකාරි
ප්‍රධාන නීතිඥ
ප්‍රධාන ඉංජිනේරු
ප්‍රධාන කෘෂිකර්ම අධ්‍යක්ෂ
ප්‍රධාන සංඛ්‍යාලේඛන නිලධාරි
ප්‍රධාන ගණකාධිකාරි
ප්‍රධාන නීතිඥ
ප්‍රධාන ඉංජිනේරු
ප්‍රධාන කෘෂිකර්ම අධ්‍යක්ෂ
ප්‍රධාන සංඛ්‍යාලේඛන නිලධාරි
ඉඩම් අධිකාරි
ඉඩම් කොමසාරිස්
ඉඩම් කොමසාරිස් (ඉවත් වී)
ඉඩම් අධිකාරි
ඉඩම් කොමසාරිස්
ඉඩම් කොමසාරිස් (ඉවත් වී)
ඉඩම් පරිපාලන නිලධාරි
ඉඩම් පරිපාලන නිලධාරි
ඉඩම් පරිපාලන නිලධාරි

1.5.1.දිස්ත්‍රික් ලේකම් මඟින් අධීක්ෂණය වන ප්‍රධාන අංශ

1. ආයතන අංශය	18.සංඛ්‍යා ලේඛන අංශය
2. ඉඩම් අංශය	19. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය
3. ඉංජිනේරු අංශය	20. ආගමික කටයුතු / භාෂා ඒකාබද්ධතා අංශය
4. අභ්‍යන්තර විගණන අංශය	21. විදේශ රැකියා කටයුතු අංශය
5. ක්‍රමසම්පාදන අංශය.	22. සංස්කෘතික අංශය
6. සංවර්ධන අංශය	23.ඵලදායිතා අංශය
7.ගිණුම් අංශය	24. මෝටර් රථ අංශය
8. සමෘද්ධි අංශය	25. දිස්ත්‍රික් ළමා හා කාන්තා කටයුතු අංශය
9. කුඩා ව්‍යාපාර අංශය	26. පුපුරණ ද්‍රව්‍ය අංශය
10.පාරිභෝගික කටයුතු අංශය	27. ක්‍රීඩා අංශය
11. ජල ජීවී වගා සංවර්ධන අංශය	28. දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය
12.දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය	29. පොලිස් කොමිසම
13. දිස්ත්‍රික් මාධ්‍ය අංශය	30. මැතිවරණ අංශය
14. මානව සම්පත් සංවර්ධන අංශය	31. ව්‍යවසාය සංවර්ධන අංශය
15.මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය	32. සමථ අංශය
16. සමාජ ආරක්ෂණ අංශය	33. අන්තරායකර ඖෂධ පාලක අංශය
17. සමාජ සේවා අංශය (වැඩිහිටි/උපදේශන)	

1.5.2. මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
1	ගඟවට කෝරළේ	11	මැදඋම්බර
2	කුණ්ඩසාලේ	12	උඩඋම්බර
3	පාතඋම්බර	13	මිණිපේ
4	පන්විල	14	අකුරණ
5	යටිනුවර	15	පූජාපිටිය
6	උඩුනුවර	16	හාරිස්පත්තුව
7	උඩපළාත	17	තුම්පනේ
8	දොළුව	18	හතරලියද්ද
9	පාතහේවාහැට	19	ගඟ ඉහළ කෝරළේ
10	දෙල්තොට	20	පස්බාගේ කෝරළේ

2.ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ උත්සව/අවස්ථා



පිරිත් සජ්ඣායනාව හා 2022 වසරේ ආරම්භය



2022.01.26 දින ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම



2022.01.26 දින ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම





2022 මහනුවර ඇසල පෙරහැර





2022.12.20 දින කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු ගීතා කුමාරසිංහ මැතිතුමියගේ සහභාගිත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති මුල් ළමාවිය දරුවන්ගේ හා තරුණතරුණියන්ගේ පෝෂණය පිළිබඳ මහනුවර දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන





2022.12.25 දින දිලුම් අමුණුගම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ආපදා රැස්වීම





2022.10.29 දින අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය සහතික කිරීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳ වැඩසටහන



ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී උදයන කිරිඳිගොඩ මැතිතුමාගේ සහභාගීත්වයෙන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නුවරඑළිය හා මහනුවර දිස්ත්‍රික්කය යාකරන බෑඔය පාලම විවෘත කිරීම.



ගරු කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කුණ්ඩසාලේ හදබිම අධිකාරියේ භවබෝග අලෙවිසැල විවෘත කිරීම.



වතු ජනතාව තුල පවතින සමාජීය ගැටළු නිරාකරණය කරගැනීම සඳහා අවිවාහක වතු ජනතාව විවාහ කරලීමේ උත්සවයක් පැවැත්වීම. - යටිනුවර ප්‍රා.ලේ.කොා.



ගරු රාජ්‍ය අමාත්‍ය නීතීඥ අනුරාධ ලංකා ජයරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉඩම් ඔප්පු, බලපත්‍ර හා දීමනා පත්‍ර ලබා දීම. (2022/03/20)



ගරු රාජ්‍ය අමාත්‍ය නීතීඥ අනුරාධ ලංකා ජයරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් “ජන ජය සෙවන” නිවාස ව්‍යාපෘතියට මුල් ගල් තැබීම. - ගුරුකැලේ රාජමලේ (2022/03/04)



ගරු රාජ්‍ය අමාත්‍ය නීතීඥ අනුරාධ ලංකා ජයරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අළුතින් රාජ්‍ය සේවයට බඳවාගත් උපාධිධාරීන්ට ස්ථිර පත්වීම් ලිපි ප්‍රධානය කිරීමේ උත්සවය. (2022.01.15)



ගරු ආනන්ද ජයවිලාල් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අඩුආදායම්ලාභීන් වෙනුවෙන් ඉදිකල නිවාස විවෘත කිරීම.



පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලක් රාජපක්ෂ මැතිතුමා, ගරු දිලුම්අමුණුගමමැතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්, භාරිස්පත්තුව ප්‍රාදේශීය සභාසභාපති ගරු ආනන්දජයවිලාල් මැතිතුමා ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් අඩු ආදායම්ලාභීන් වෙත ජීවනෝපාය ආධාර ලබාදීම.



ගරුපාර්ලිමේන්තු මන්ත්‍රී උදයන කිරිඳිගොඩ මැතිතුමා සහ පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ සහභාගීත්වයෙන්දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගලහ මොරගොල්ල ප්‍රධාන මාර්ගයේ නව පාලම් ඉදිකිරීම සඳහා මුල්ගල්



මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගුණතිලක රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අකුරණ පිහා ඔය සංවර්ධන ව්‍යාපෘතියට මුල් ගල තැබීම.



පළාත් ආණ්ඩුකාර ලලිත් යූ.ගමගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්රජවැල්ල කණිෂ්ඨ විද්‍යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය.



ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී/ මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති ගුණතිලක රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්“ලක්ශිල්ප හස්ත කර්මාන්ත” අලෙවි සැල විවෘත



මහාචාර්ය රංජිත් බණ්ඩාර මැතිතුමාඅතින් මාවිකුඹුර සමූහ ගොවිපල ආරම්භ කිරීම.



අයවැයෙන් ලක්ෂයක් වැඩසටහන යටතේ දඩුබැදිරුප්ප වසමේ සේවා පියසට මුල් ගල තැබීම.



ගරුපාර්ලිමේන්තු මන්ත්‍රී ගුණතිලකරාජපක්ෂ මැතිතුමා ගේ සහභාගීත්වයෙන් වැලිගල්ල වසමේ සෞභාග්‍යා බිම්මල්නිෂ්පාදන ගම්මානය විවෘත කිරීම.



ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී තුමා අතින් පූලියද්ද, ඇතුල්ගම බටහිර හා ඇතුල්ගම දකුණ වසම් සඳහා පූලියද්ද වසා ඇති පාසලේ ගොඩනැඟිල්ලක් අලුත්වැඩියා කර කුඩා ඇහලුම් කර්මාන්ත ශාලාවක්ආරම්භ කිරීම.



පාතදුම්බර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති ගරු ලෝහාන් රත්වත්තේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ගමසමග පිළිසඳර සමාරම්භක උත්සවය.



ගරු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්අභ්‍යාසලාභීන් ලෙස පුහුණුව ලැබූ උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් 45 දෙනෙකු සඳහා ස්ථිර පත්වීම් ලිපි ලබාදීම.



ගරු විදේශ කටයුතු අමාත්‍ය ජී.එල් පීරිස් මැතිතුමා සහ ගරු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉඩම් හිමිකම්පත් බෙදාදීම.



ව්‍යාපෘතිය- ඉහලවෙල සේවා පියස ඉදිකිරීම.

ප්‍රතිපාදන මුදල-රු.ලක්ෂ 30 - කුණ්ඩසාලේ ප්‍රා.ලේ. කොට්ඨාශය



ව්‍යාපෘතිය- මැණික්හින්න මැදගම්මැද්ද උඩකුඹුර යාය හරහා කෘෂිකාර්මික මාර්ගය සංවර්ධනය

ප්‍රතිපාදනමුදල - රු.ලක්ෂ 10 - කුණ්ඩසාලේ ප්‍රා.ලේ. කොට්ඨාශය



ව්‍යාපෘතියේනම - ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ - කැටකහල වසමේ නුගසෙවනේ සිට අගුන්කුඹුර වෙල්යාය මාර්ගයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම

ප්‍රතිපාදනමුදල රු.-1,200,000 පාතදුම්බර ප්‍රා.ලේ. කොට්ඨාශය



ව්‍යාපෘතියේ නම - මොරහේන ගම මැද මාර්ගය (අයවැයෙන් වැඩ ලක්ෂයක්- ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2022)

ප්‍රතිපාදන මුදල - රු. 1,000,000.00

දොළුව ප්‍රා.ලේ. කොට්ඨාශය



ව්‍යාපෘතියේ නම නම-සත්ත්ව පාලනය සඳහා නම් කරන ලද අයවලුන් සඳහා අවශ්‍යතාවය අනුව සතුන් හා උපකරණ ලබා දීම.

ප්‍රතිපාදන මුදල -රු.300,000.00

මැදදුම්බර ප්‍රා.ලේ. කොට්ඨාශය



ව්‍යාපෘතියේ නම - දුණුවිල වැව ප්‍රතිසංස්කරණය

ප්‍රතිපාදන මුදල-පළාත්සභා/මධ්‍යම රජය(අයවැයෙන් වැඩ ලක්ෂයක්)- රු.මි. 7.9

අකුරණ ප්‍රා.ලේ. කොට්ඨාශය



ව්‍යාපෘතියේනම-පිටවල උඩගම්මැද්ද සිට පහල පිටවල දක්වා වෙල මැද දුම්බිලියාව මාර්ගය සංවර්ධනය කිරිම**ප්‍රතිපාදන මුදල-** රු. 1,600,000.00

උඩදුම්බර ප්‍රා.ලේ. කොට්ඨාශය



ව්‍යාපෘතියේ නම- - උඩදුම්බර - වැඩිහිටි දිවා මධ්‍යස්ථානයක් ඉදි කිරීම.

ප්‍රතිප්‍රතිපාදන මුදල- රු. 1,500,000.00

උඩදුම්බර ප්‍රා.ලේ. කොට්ඨාශය



ව්‍යාපෘතියේ නම - විසිතුරු මල් වගාව

ප්‍රතිපාදන මුදල- රු.7,207,000.00

පාතහේවාහැට ප්‍රා.ලේ. කොට්ඨාශය



ව්‍යාපෘතියේ නම - කුඩා ඇඟළුම් කර්මාන්ත
ප්‍රතිපාදන මුදල- රු.12,445,000.00
පාතහේවාහැට ප්‍රා.ලේ. කොට්ඨාශය





ව්‍යාපෘතියේ නම - බැද්දේගම එගොඩගම හරහා විහාරස්ථානය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම.
ප්‍රතිපාදන මුදල රු - 1,200,000.00
පන්විල ප්‍රා.ලේ. කොට්ඨාශය

2022 වසරේ සිදු වූ ආපදා





වන අලි හේතුවෙන් මිනිපේ කොට්ඨාශයේ සිදු වූ ජීවිත / දේපල හා වගා හානි



අධික වර්ශාව හේතුවෙන් මැදවල ගොපලවත්ත ප්‍රදේශයේ සිදුවූ ආපදා තත්වය - හාරිස්පත්තුව ප්‍රා.ලේ .කොට්ඨාශය



පැවති අධික වර්ෂාව නිසා මුල්ලේගම දකුණ වසම, වෙලේකඩේරඹුකේවෙල ප්‍රදේශය ගංවතුරට යට වීම - පූජාපිටිය ප්‍රා.ලේ කොට්ඨාශය



අධික වර්ෂාව හේතුවෙන් ගල්මඩුව මාර්ගය කැඩී යාම - කුණඩසාලේ ප්‍රා.ලේ. කොට්ඨාශය



හුන්නස්ගිරිය ප්‍රදේශය ආශ්‍රිත නකල්ස් රක්ෂිතයේ ඇති වූ ගින්න ජීවිත හා දේපල හානි ඇති නොවන ආකාරයෙන් පාලනය කිරීම.(2022.07.10)–
උඩදුම්බර ප්‍රා.ලේ.කොට්ඨාශය

2022 වසරේ ලබා ඇති ජයග්‍රහණ



ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය 2020 - රාජ්‍ය අංශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ප්‍රථම ස්ථානය ලබා ගැනීම- කුණ්ඩසාලේ ප්‍රා.ලේ.කොා



2020 වර්ෂයේ ජාතික ඵලදායිතා තරඟාවලියේ කුසලතා සම්මානයක් ලැබීම. (සම්මාන ප්‍රධානය 2022 වර්ෂය) - පූජාපිටිය ප්‍රා.ලේ.කොා.



ඩුබායි හි පැවැත්වූ බර එසවීමේ ඉසව්වෙන් ආසියානු ශූරතාවය සඳහා සහභාගී වූ කණ්ඩායම



2022 වර්ෂයේ පැවති 2020වර්ෂයට අදාළ ජාතික ඵලදායිතා සම්මාන උළෙලේ දී පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විශිෂ්ඨ කුසලතා සම්මානය ලබාගැනීම



සමස්ථ ලංකා ශක්ති සවි එසවීමේ තරඟාවලිය සඳහා සහභාගී වූ කණ්ඩායම



ඩුබායි හි පැවැත්වූ බර එසවීමේ ඉසව්වෙන් ආසියානු ශූරතාවය දිනාගත් රන්සිළු ජයතිලක



සිංගප්පූරුවෙහි පැවැත්වූ අන්තර්ජාතික බර ඉසිලීමේ ශූරතාවය දිනාගත් උෂාන් චාරුක විදානපතිරන



සමස්ථ ලංකා ශක්ති සවි එසවීමේ තරඟාවලියේ (ජේෂ්ඨ) පළමු ස්ථානය දිනාගත් එස්.කේ.එස්. ප්‍රදීප් (දක්ෂතම බර ඔසවන්නා)

➢ දිස්ත්‍රික් 25 අතුරින් ජාතික සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට බඳවා ගැනීම් 2138 ක් සිදු කර ජාතික මට්ටමේ 08 වන ස්ථානය ලබා ගැනීම.

අභියෝග

- සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගත හැකි ඉඩම් වෙනත් ආයතනවලට අයත් වීම හා ඒ හා සම්බන්ධ නීති.
- සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම හේතුවෙන් ඇස්තමේන්තු සැකසීමේදී හා සැපයුම්කරුවන් හඳුනාගැනීමේ දුෂ්කරතා ඇතිවීම.
- වර්ෂ අවසානයේ ව්‍යාපෘති අනුමතවීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වුවත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කිරීමට සිදුවීම හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- ආර්ථික අර්බුදය හමුවේ සුභසාධන ප්‍රතිලාභ බලාපොරොත්තු වන පුද්ගලයන් සංඛ්‍යාව අධික ලෙස ඉහළ යාම.
- කොට්ඨාශයේ පානීය ජල අවශ්‍යතාවන් සපුරාලීමට ප්‍රමාණවත් ජල මූලාශ්‍ර නොමැතිවීම හා පවතින ජල මූලාශ්‍ර වලට ළඟා වීම අපහසු වීම.
- ඉහළ කඳුකර ප්‍රදේශ වල සංවර්ධන කටයුතු සිදු කිරීමේ අපහසුව.
- වන සතුන්ගෙන් සිදුවන හානිය හේතුවෙන් කෘෂි භෝග වල අස්වැන්න අඩු වීම.
- ආපදා සහ ජල ගැලීම් ඇතිවීම.
- ග්‍රාමීය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- දුෂ්කර ප්‍රදේශ වල පවතින සන්නිවේදන අපහසුතා සහ තාක්ෂණික ගැටළු.
- ජන වර්ග අතර සම්මුතීන් සහ ආකල්ප.
- බහු ජනවාර්ගික කොට්ඨාශ වල සන්නිවේදනයේදී භාෂා ගැටළු උද්ගත වීම.
- අඩු පහසුකම් සහිත ප්‍රාදේශය ලේකම් කොට්ඨාශ වල කාර්යාලයට පැමිණීම,පිටවීම සහ ක්ෂේත්‍ර කටයුතු වලදී නිලධාරීන්ට සිදුවන ප්‍රවාහන අපහසුතා.
- ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වලමනා ව්‍යුහයකින් යුක්ත ප්‍රමාණවත් ඉඩකඩක් සහිත කාර්යාල ගොඩනැගිල්ලක් නොමැති වීම හේතුවෙන් කාර්යාලීය නිලධාරීන් හට මෙන්ම මහජනතාවට ද ඇතිවන අපහසුතා.

ඉදිරි ඉලක්ක

- රජයේ ඉඩම් වල පදිංචිව සිටින මෙතෙක් බලපත්‍ර / දීමනාපත්‍ර නොමැති සියළුම පුද්ගලයන් වෙත නීත්‍යානුකූල අයිතියක් ලබා දීම.
- මහජනතාවට ලැබෙන සේවාවන් අපහසුතාවයෙන් තොරව ලබාදීමට අදාලව සියලු ග්‍රාම නිලධාරි වසම්වල නිලසෙවන කාර්යාල ඉදිකිරීම.
- මූලික අවශ්‍යතා වන පානීය ජලය හා විදුලිය සෑම දෙනාටම ලබාදීම.
- ආර්ථික අභියෝග හමුවේ කොට්ඨාශය තුළ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම.
- ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කරමින් ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීම.
- මාර්ග පහසුකම් සංවර්ධනය කිරීම තුලින් ප්‍රදේශයේ ප්‍රවාහන පහසුකම් ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම.
- විද්‍යා හා තාක්ෂණ සේවා දියුණු කරමින් කොට්ඨාසයේ තොරතුරු හා සන්නිවේදන දැනුම පුළුල් කිරීම.
- කොට්ඨාසයේ සංස්කෘතික උරුමය ආරක්ෂා කර පෝෂණය කිරීම.
- විරැකියාවෙන් යුතු තරුණ පිරිස නව ආයෝජන සඳහා දිරිමත් කිරීම.
- ගොවි ජනතාවගේ ආහාර භෝග අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වසර 2025 වන විට සියළු ගොවි පවුල් අතිරේක භෝග වගාවට යොමු කිරීම.
- ඓතිහාසික ස්ථාන ආශ්‍රිතව සංචාරක පුරවර ඇති කිරීම හා ඒ ආශ්‍රිත රැකියා බිහි කිරීම.
- ආක්‍රමණික ශාක ඉවත් කර ජල පෝෂක ප්‍රදේශ වල රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .
- වතු ප්‍රජාවගේ සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම හා ආකල්ප සංවර්ධනය.
- ගෘහස්ථ හිංසනය හා ළමා ආරක්ෂාව පිළිබඳව සුපරීක්ෂාකාරීව ක්‍රියා කිරීම..
- "උත්තම පූජා" ගැබිණි මව්වරුන් 15000කට පෝෂණ දීමනාව ලබා දීමේ වැඩසටහනක් පැවැත්වීම.
- අඩුආදායම් ළමුන් 100ක් සඳහා කැපකරු දෙගුරු අධ්‍යාපන ආධාර ලබාදීම.
- පාසල් නොයන ළමුන් 100ක් පාසල් ගත කර අධ්‍යාපන උපකරණ ලබාදීම.
- අවදානම් ළමුන් 40ක් සඳහා වෛද්‍ය, පෝෂණ, නිවුන්දරු උපත් ආදී විවිධ ආධාර ලබාදීම.
- ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව සාර්ථක ව්‍යවසායිකාවන් ඇගයීමට දිස්ත්‍රික් කාන්තා දින උත්සවයක් පැවැත්වීම.
- කාන්තාවන් ආර්ථික වශයෙන් බලගැන්වීම සඳහා වලං කර්මාන්තය වැඩිදියුණු කිරීම, ගෘහ ආශ්‍රිතව අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීම ආදී ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
- පෙර පාසැල් දරුවන් 250 ක් ආරම්භාව යෝජනා ක්‍රමයට දායක කර ගැනීම.

- විදේශ ගත වන පුද්ගලයින් 300 ක් මනුසවිය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක කරගැනීම.
- විදේශ ගත වීමට අපේක්ෂිත කාන්තාවන් මෙරටදී බලගැන්වීම.
- අවු.70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 25834කට ජීවන ආධාර ලබාදීම.
- අවු.100ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 37කට ජීවන ආධාර ලබාදීම.
- අවු.60ට වැඩි කැනැක්තන් 2500කට වැඩිහිටි හැදුනුම්පත් ලබාදීම.
- ප්‍රතිලාභීන් 27 දෙනෙකු සඳහා මී මැසි පාලන ව්‍යාපෘති ආරම්භ කිරීම.
- ප්‍රතිලාභීන් 12 දෙනෙකු සඳහා බිම්මල් වගා ව්‍යාපෘති ආරම්භ කිරීම.
- සමස්ත ප්‍රජාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණ සිතියම් සැකසීම.
- තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා පස හා ජල සංරක්ෂණය තුළින් උෂ්ණ පරිහරණ කෘෂිකාර්මික බිම් වල ඵලදායිතාවය ඉහළ නැංවීම.
- සමස්ත ප්‍රජාව සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ජල මූලාශ්‍ර හඳුනා ගැනීම හා සිතියම් ගත කිරීම.

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි.

චන්දන තෙන්නකෝන්
දිසාපති / දිස්ත්‍රික් ලේකම් මහනුවර සහ
අතිරේක ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු ,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

03 පරිච්ඡේදය - 3.1. මූල්‍ය කාර්යසාධන

එෆ්සිඒ-එන්ජ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2021 වැඩි/(අඩු)		සටහන	2022	2021	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එෆ්සිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
			-		
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිතම		5,689,259,000	7,469,405,000	එෆ්සිඒ-3
-	කැන්පතු		503,972,403	726,873,826	එෆ්සිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		88,621,685	81,131,151	එෆ්සිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		6,281,853,088	8,277,409,977	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන				
-	ලැබීම් ඇ = (අ)+(ආ)		6,281,853,088	8,277,409,977	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	2,500,000.00	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන				
	ලැබීම් ඉ = (ඇ)-(ඈ)		6,281,853,088	8,274,909,977	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
1,519,985,000	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,465,434,446	1,326,502,716	
146,265,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	134,942,401	134,395,825	එෆ්සිඒ-2(ii)
12,750,000	සභාගාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	8,595,903	458,704,719	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,679,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඒ)		1,608,972,750	1,919,603,260	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
20,400,000	වැඩිදියුණු කිරීම්	10	18,470,951	13,112,015	
6,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	5,945,643	113,695,902	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එෆ්සිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
600,000	හැකියා වර්ධනය	14	297,511	199,683	
744,000,000	වෙනත් මූලධන වියදම්	15	715,907,396	-	
771,000,000	මුළු මූලධන වියදම් (ඓ)		740,621,501	127,007,600	
	කැන්පතු ගෙවීම්		736,029,047	738,563,600	එෆ්සිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		78,984,103	74,810,160	එෆ්සිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (උ)		815,013,150	813,373,760	
	මුළු වියදම් එ = (ඒ+ඓ+උ)		3,164,607,401	2,859,984,620	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		3,117,245,687	5,414,925,357	
	අයිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		3,117,245,687	5,414,925,357	එෆ්සිඒ-7
	දෙසැම්බර් 31 දිනට අයිම ශේෂය			-	එෆ්සිඒ-3

3.2. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒසිඒ-පි

2022 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන		කණ්ඩායම	
			2022	**2021**
			රු.	රු.
මූල්‍ය නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6		6,872,234,386	6,662,699,891
මූල්‍ය වත්කම්				
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)		201,024,234	209,910,129
මූදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		-	-
මුළු වත්කම්			**7,073,258,620**	**6,872,610,020**
ශුද්ධ වත්කම් / ස්කන්ධය				
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්			48,620,251	(174,550,499)
දේපළ පිරියත හා උපකරණ සංචිතය			6,872,234,386	6,662,699,891
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		-	-
ජංගම වගකීම්				
තැන්පතු ගිණුම්	ඒසිඒ-4		152,403,983	384,460,628
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		-	-
මුළු වගකීම්			**7,073,258,620**	**6,872,610,020**

පිටු අංක07 සිට 47 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 48 සිට 55. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම් පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට පදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් යම්හ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය යදහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත කරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :වන්දන තෙන්නකෝන්	
තනතුර :	තනතුර :දිස්ත්‍රික් ලේකම්	නම :ජේ.එම්.එස්.බණ්ඩාර
දිනය : 2023.	දිනය : 2023.02.15	දිනය :2023.02.15

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ස්වදේශ කටයුතු අංශය

වන්දන තෙන්නකෝන්
දිසාපති දිස්ත්‍රික් ලේකම්
මහනුවර සහ
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්

ජේ. එම්. එස්. බණ්ඩාර
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මහනුවර

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුල් බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	444,588,916	314,599,099
අග්‍රිම ලැබීම්	5,689,259,000	7,469,405,000
අත්තිකාරම් අයකර ගැනීම්	131,124,877	126,997,544
තැන්පතු ලැබීම්	503,972,403	726,873,826
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**6,768,945,196**	**8,637,875,469**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,616,425,589	1,473,982,389
සහනාධාර සහ මාරුකිරීම්	8,595,903	458,704,719
ආදායමෙන් ආපසු ගෙවීම්	9,238,899	95,101,710
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,159,279,206	3,964,344,180
භාණ්ඩාගාරයට සියවන ලද අග්‍රිම්	-	2,500,000
අත්තිකාරම් ගෙවීම්	118,773,150	110,573,811
තැන්පතු ගෙවීම්	736,029,047	738,563,600
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**5,648,341,794**	**6,843,770,409**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,120,603,402**	**1,794,105,060**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	1,120,603,402	1,794,105,060
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,120,603,402**	**1,794,105,060**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(1,120,603,402)**	**(1,794,105,060)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(එ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය: 258 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය , මහනුවර

රු.

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	1,679,000,000	-	-	1,679,000,000	1,608,972,748	70,027,252
	(2) ප්‍රාග්ධන	771,000,000	-	-	771,000,000	740,621,502	30,378,498
	උප එකතුව	**2,450,000,000**	-	-	**2,450,000,000**	**2,349,594,250**	**100,405,750**
වැඩසටහන (2)	(1) පුනරාවර්තන						
	(2) ප්‍රාග්ධන						
	උප එකතුව	-	-	-	-	-	-
	මුළු එකතුව	**2,450,000,000**	-	-	**2,450,000,000**	**2,349,594,250**	**100,405,750**

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරි/
අොන්ස (මෙදි) / කොන්සාරිස් (මෙදි)
දිනය: 2023.02.15

ඒ.එම්.ඩබ්.එස්. බණ්ඩාර
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මහනුවර

වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය: 258

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය , මහනුවර

රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		
	(1)	(2)	(3)	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)	(8)	(9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
පුනරාවර්තන වියදම්											
<u>පුද්ගල පඩිනැඹී</u>											
1001 වැටුප් හා වේතන	992,000,000			992,000,000	961,916,409						961,916,409
1002 අතිකාල හා නිවාඩු දින වැටුප්	23,800,000			23,800,000	19,333,725						19,333,725
1003 වෙනත් දීමනා	504,185,000			504,185,000	484,184,309						484,184,309
<u>ඉඹන් වියදම්</u>											
1101 දේශීය	16,200,000			16,200,000	16,192,562						16,192,562
<u>සැපයීම්</u>											
1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	19,000,000			19,000,000	18,933,873						18,933,873
1202 ඉන්ධන	20,700,000			20,700,000	17,390,114						17,390,114
1203 ආහාර පාන හා නිල ඇඳුම්	300,000			300,000	234,190						234,190
1204 ඖෂධ සැපයීම්	-										
1205 වෙනත්	-										
<u>නඩත්තු වියදම්</u>											
1301 වාහන	15,000,000			15,000,000	14,261,577						14,261,577
1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	4,000,000			4,000,000	3,783,843						3,783,843
1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	6,000,000			6,000,000	5,888,180						5,888,180
<u>සේවා</u>											
1401 ප්‍රවාහන	-			-							
1402 තැපැල් හා සන්නිවේදන	12,000,000			12,000,000	8,326,305						8,326,305
1403 විදුලිය හා ජලය	12,500,000			12,500,000	10,810,792						10,810,792

ඒසිඒ - 2(i)

වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය: 258

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය , මහනුවර

රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		
	(1)	(2)	(3)	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)	(8)	(9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
<u>වෙනත් මූලධන වියදම්</u>											
2509 වෙනත්	744,000,000			744,000,000	715,907,397						715,907,397
මුළු එකතුව	**771,000,000**	-	-	**771,000,000**	**740,621,502**	-	-	-	-	-	**740,621,502**
ශීර්ෂය 258 -මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 11 දරන ජාතික විගණන පනතේ 19 ංක 2018(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ .2018 අංක දරන ජාතික විගණන 19 11 පනතේ(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි මස 10 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් දිනට 31මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(සැ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇතිකර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රඥප්ති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පැති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භෙළිදරවිකිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ භෙළිදරවිකිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා ඒනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය විය යුතු වුවත්, වත්කම් විෂයයන් 05 ක ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයට වඩා රු.9,818,250 ක් වැඩියෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස දක්වා තිබුණි.

(ආ) ශේෂ පිරික්සුම අනුව ජංගම නොවන වත්කම් විෂයයන් 05 ක සමාලෝචිත වර්ෂයේ එකතු කිරීම් රු.722,860,733 ක් දක්වා තිබුණද, ACA-6(SA 82)වාර්තාව අනුව ශේෂය රු.730,262,483 ක් වූයෙන් වත්කම් විෂයයන් 05 ක රු.7,401,750 ක වෙනසක් ද, ජංගම නොවන වත්කම් විෂයයන් 02 ක සමාලෝචිත වර්ෂයේ බැහැර කිරීම් ශේෂ පිරික්සුම් පතුව ශේෂය රු.10,696,288 ක් දක්වා තිබුණුදACA-6(SA82) වාර්තාව අනුව ශේෂය රු.15,021,788 ක් වූයෙන් වත්කම් විෂයයන් 02 ක රු.4,325,500 ක වෙනසක් පැවතුණි.

1.6.2 මූල්‍ය වත්කම්

සමාලෝචිත වර්ෂය තුළ යටිතුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය හැර ගිය නිලධාරියෙකුගේ අයකරගත නොහැකි රු.63,885 ක ණය ශේෂය කපාහැර තිබුණත්, මූල්‍ය ප්‍රකාශය එය පාඩු හා කපා හැරීම් පිළිබඳ ප්‍රකාශයේ (සටහනii) ඇතුළත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ වැය විෂයයන් 02 ක් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා රු.428,951 ක බැරකම්වලට එළඹ තිබුණි.

2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	-	
i. xix වන පරිච්ඡේදයේ 6.1හා 7.2 උපවගන්ති		නියැදි පරීක්ෂාවට අනුව පොරොත්තු ලේඛනයේ නිලධාරීන් සිටියදී රජයේ නිවාස ලබාදුන්, බදු කාලය වසර 5 ක් ඉක්ම ගොස් ඇති නිලධාරීන් 05 කට කාලය දීර්ඝ කර පදිංචිව සිටීමට ඉඩකඩ ලබා දී තිබුණු අතර, බදු කාලය ඉක්මවා පදිංචිව සිටී කාලය වෙනුවෙන් අයකළ යුතු දණ්ඩන කුළිය හා ප්‍රධාන තක්සේරුකරුවෙකු විසින් තක්සේරු කරන ලද පවත්නා වෙළඳපල කුළිය අයකර ද නොතිබුණි.
ii. xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 උප වගන්ති	-	2013 වර්ෂයේ මැයි සිට 2021 වර්ෂයේ ජූලි මස දක්වා කාල පරිච්ඡේදය තුළ වැඩ තහනම් කර ඇති හා සේවය අතහැර ගිය නිලධාරීන් 04දෙනෙකු වෙත ලබා දී තිබුණු එකතුව රු.390,401 ක ණය ශේෂ අයකරගෙන නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
මු.රෙ. 757		මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අදාළ ග්‍රාම නිලධාරී කාර්යාල හා ආර්ථික සංවර්ධන නිලධාරී කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2019 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබුණි.

(ඇ) රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් නිකුත් කළ චක්‍රලේඛ

(i)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 08 ක ඉන්ධන දහන පරීක්ෂාව වසර 1ත් වසර 10ත් අතර කාලයක් සිදුකර නොතිබුණි.
(ii)	2017 පෙබරවාරි 15 දිනැති අංක 2017/03 දරන දිවිනැඟුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 04 ඡේදය, 2018 මාර්තු 07 දිනැති අංක 2018/03 (ප්‍රාර්ථික සවිබල ගැන්වීම) දරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 10 ඡේදය	සමෘද්ධි ප්‍රජාව සවිබල ගැන්වීමට ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති නිශ්චිතව නාමකර තිබුණ ද ඊට අදාළ නොවන ඇගළුම් කර්මාන්තය සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 ක ප්‍රතිලාභීන් 821 ක් හෙවත් සමස්ත ප්‍රතිලාභීන්ගෙන් සියයට 33 ක් වෙත ජුකි මැෂින් 821 ක් ලබාදී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

(අ) පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක පැෂන් වගා ව්‍යාපෘතිය සඳහා බවුලාන හා වෙලේගම ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි ප්‍රතිලාභීන් පිළිවෙලින් 26 ක් හා 06 ක් වෙත රු.3,200,000 ක් වැයකර එක් ප්‍රතිලාභියකුට පක්කර ¼ ක් සඳහා පැෂන් පැළ 95 ක් කම්බි කිලෝ 10 ක් සහ විදුලි පඹයා බැගින් ලබාදී තිබුණි. එසේ වුවද, බවුලාන වසමේ ප්‍රතිලාභීන් 26 දෙනෙකු වෙත ලබාදුන් පැෂන් පැළවලින් සියයට 90 ක් පමණ විනාශ වී තිබුණු අතර, වෙලේගම වසමේ ප්‍රතිලාභීන් 03 දෙනෙකුගේ පැළවලින් සියයට 66 සිට සියයට 93 ක් අතර පරාසයක ප්‍රමාණයක් පැළ විනාශ වී තිබුණි. ඉතිරි වී තිබුණු පැෂන් පැළ හෞතිකව පරීක්ෂාවෙදී ඒවා සාරවත්ව වර්ධනය වී නොතිබුණි. ඒ අනුව මෙම වගාව වෙනුවෙන් වැයකරන ලද රු.3,200,000 ක් හා ගොවීන් විසින් දරන ලද ශ්‍රමය හා අනෙකුත් වියදම් නිෂ්කාර්ය වී තිබුණි.

(ඌ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මිණිපේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ බුලත් වැල්කඳුර ග්‍රාම නිලධාරී වසමේ අඩු ආදායම්ලාභී පවුල් 43 ක් තෝරාගෙන රු.1,732,500 ක් වැයකර පිටි ඇඹරුම් කර්මාන්තයක් ආරම්භ කර තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ නිෂ්පාදනය කරනු ලබන සහල්, කුරහන් වැනි පිටි වර්ගඅලෙවි කිරීමට හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලියක් දැනි කිරීමට සැලසුම් කර නොතිබීම හේතුවෙන් ප්‍රතිලාභීන්ට මෙම නිෂ්පාදන අලෙවි කිරීමට නොහැකි වී තිබුණි

(ඇ) ගහඉහළ කෝරළේ හා දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එකතුව රු.11,288,940ක් වැයකර ක්‍රියාත්මක කළ වැනිලා ගම්මාන ව්‍යාපෘතිවල සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ අංක 2021/01 දරන මාර්ගෝපදේශ සංග්‍රහයට පරිභාහිරව කටයුතු කර ප්‍රතිලාභීන්ගෙන් 21 දෙනෙකු රාජ්‍ය සේවය හා සම්බන්ධිත පවුල්වල පුද්ගලයින් හා ඉහළ ආදායම් මට්ටම්වල පුද්ගලයින් බව නිරීක්ෂණය විය.

(ඈ) ඉකුත් වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ සුදු යකඩ තාච්චි බෙදා දීම වෙනුවෙන් රු. 553,392ක වියදමක් දරා තිබුණි. ඇණවුම් කළ ප්‍රමාණයට වඩා කුඩා ප්‍රමාණයේ තාච්චි මිලට ගැනීම හේතුවෙන් කුඩා තාච්චි භාවිතා කර ප්‍රතිලාභියාට අපේක්ෂිත අරමුණ කරා ළඟාවීමට නොහැකි වී තිබුණි.

(ඉ) ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මිණිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කහ වගා ව්‍යාපෘතියක් සඳහා වසම් 01 ක ප්‍රතිලාභීන් 10 දෙනෙකුට රු.475,800 ක් වැය කර කහ කිලෝ 610 ක් ලබාදී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව ලබාදුන් කහ බීජ ප්‍රරෝහණය වී නොතිබීම හේතුවෙන් වැයකළ මුදල් නිෂ්කාර්ය වී තිබුණි.

(ඊ) ගම සමඟ පිළිසඳරක් වැඩසටහනේ ගහවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිසර අලංකරණ වැඩසටහන යටතේ අතුරු මාර්ගය අවට පැළ සිටුවීම වෙනුවෙන් රු. 608,055 ක් වැයකර පැළ 156 ක් මිළදී ගෙන තිබුණද, ඉන් පැළ 104 ක් මිය ගොස් තිබුණි. ඒ අනුව අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 771 අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ඉකුත් වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වීසින් අපහරණය කළ යුතු බවට නිර්දේශ නොකළලි බඩු උපකරණ හා යන්ත්‍රෝපකරණ ඒකක 19 ක් අපහරණය කර තිබුණි.

3.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලේවැල්ල පාරේ ධර්මාශෝක මාවතේ බෝධිවනය අතුරු මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වැඩවිෂය අංක 01, 02, හා 06 හි සඳහන් කොන්ක්‍රීට් කුළුණු, කොන්ක්‍රීට් බීම් හා කම්බි යෙදීම් ඉටුකර නොනිබියදී ඒ වෙනුවෙන් එකතුව රු.94,832 ක් කොන්ත්‍රාක්කරු වෙත ගෙවීම් කර තිබුණි.

(ආ) ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දෙයියන්නෙවෙල ග්‍රාම නිලධාරී කාර්යාලයේ ඉහළ මහල ඉදිකිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 14 හි වර්ග මීටර් 4.4 ප්‍රමාණයක බිත්ති ඉදිකර නොනිබියදී ඒ වෙනුවෙන් රු.10,856 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(ඇ) ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක පරිසර අලංකරණ වැඩසටහනේ මල් පෝච්චි සහ පැල මිලදී ගැනීමෙදි ඇණවුම් කළ පිරිවිතරයන්ට අනුකූල නොවන පැළ මිලදී ගැනීම හේතුවෙන් එකතුව රු.190,025 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) ගම සමඟ පිළිසඳරක් වැඩසටහනේ යටිතුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පරිසර සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ රවුම් මල් පෝච්චි 59 ක් හා හතරැස් මල් පෝච්චි 12 ක් අණවුම්කර තිබුණද, ඇණවුම් කරන ලද පිරිවිතරවලට අනුකූල නොවූ රවුම් මල් පෝච්චි 11 ක් හා හතරැස් මල් පෝච්චි 10 ක් ලැබී තිබියදී ඒ ගැන පරීක්ෂාවක් නොකර මල් පෝච්චි 71 ක් සඳහා රු.118,600 ක් ගෙවීම් කිරීමට වවුචර් පිලියෙල කර තිබුණි. එසේම ඒ සඳහා 2022 අගෝස්තු 17 දින රු.118,600 කට ලියන ලද චෙක්පත 2023 ජනවාරි 30 දින වන විටත් විෂය භාර නිලධාරීන් භාරයේ රඳවාගෙන තිබුණි.

(ඉ) කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කරේයාලයේ කලාසිරිගම පැරණි හස්ත කර්මාන්ත ගොඩනැගිල්ල අසළ නව ප්‍රජාශාලාව ඉදිකිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 18 යටතේ ආරක්ෂක කම්බිදැල් පාවරණය වර්ග මීටර් 39.6 ක් ඉදිකර තිබුණද, වර්ග මීටර් 65.68 ක් ඉදිකළ බවට කාර්මික නිලධාරී නිර්දේශකර කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබීම හේතුවෙන් වර්ග මීටර් 26.08 ක් වෙනුවෙන් රු. 227,548 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

(අ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09 ක නායයෑම් හා අධි අවධානම් ලෙස නම් කළ ප්‍රදේශවල පවුල් 1,070 ක් ජීවත්වන බව හඳුනාගෙන තිබුණ ද ඔවුන් වෙනත් ස්ථානයක පදිංචි කරවීම් හෝ විකල්ප අවස්ථාවක් කරා යොමු නොකර අධි අවධානම් ප්‍රදේශයේම ජීවත්වීමට ඉඩහැර තිබුණි.

(ආ) ගම ඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අධි අවධානම් ප්‍රදේශවල පදිංචි පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ කුරුදුවත්ත ඉඩම පර්වස් 10 බැගින් වූ කැබලි 234 ට බෙදා තිබුණි. ඉන් ඉඩම් කැබලි 73 ක් පදිංචියට නුසුදුසු බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ හා සංවිධාන ආයතනය වාර්තා කර තිබුණ ද ඉන් පදිංචියට නුසුදුසු ඉඩම් කැබලි 43 ක් පුද්ගලයන්ට බෙදා දී රු.200,000 ක් බැගින් වූ පළමු වාරිකය ලෙස රු.8,600,000 ක් ගෙවා තිබුණි.

(ඇ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 ක බල ප්‍රදේශය තුළ පිහිටි විවිධ දෙපාර්තමේන්තු, පාසල් හා පළාත් පාලන ආයතන භුක්තිවිඳින රජයේ ඉඩම් ඒ ඒ ආයතන වෙත නීත්‍යානුකූලව පැවරීම් කටයුතු සිදු කිරීමේදී වර්ෂ 04 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද මේ දක්වා පැවරීම් කටයුතු සිදුකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජීවනෝපාය ක්‍රියා ණය අරමුදල් ගිණුමේ එකතුව රු.176,654,710 ක් වූ අතර, ඉන් සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විට රු.115,504,354 ක ණය ශේෂයක් පිටනිරිව තිබුණි. මෙයින් ණයලාභීන් 128 දෙනෙකුගේ රු.4,770,272 ක ණය කල්පහු වී තිබුණු අතර, ණයලාභීන් 105 දෙනෙකුගේ රු.6,112,935 ක ණය බොල් ණය බවට පත්ව තිබුණි.

(ඉ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 හි ක්‍රියාත්මක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහනේ අරමුදල් ගිණුම්වල සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.52,530,887 ක ශේෂයක් පැවති අතර, ණයලාභීන් 1779 ක් වෙත රු.61,534,600 ක ණය ලබාදී තිබුණි. ඉන් ණයලාභීන් 319 දෙනෙකුගෙන් රු.8,613,503 ක ණය අය කිරීම් අත්හැර දමා තිබුණි.

(ඊ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 08 ක විශ්‍රාමිකයින් 78 දෙනෙකු වෙත විවිධ හේතූන් මත රු.27,563,134 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. එම මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.2,503,096 ක් පයකර ගෙන නොතිබුණි.

04. මානව සම්පත් කළමනාකරණය

2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළකළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01 හි) viii වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධාන හා 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/ 2001 මගින් රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබුණද, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09ක නිලධාරීන් 140 ක් වසර 06 ත් 24 ත් අතර කාලයක් එකම කාර්යාලයේ සේවය කර තිබුණි.

එච්.ඒ.ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : ප්‍රධාන්ක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1.1. ක්‍රමසම්පාදන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ගමසමඟ පිලිසඳර වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව	භාණ්ඩාගාර ලේකම්ගේජාතික අයවැය චක්‍රලේඛඅංක 03/2022හා 2022.04.26 දිනැතිරාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛයට අනුව සියළු සංවර්ධන කාර්යයන්අත්හිටුවීම		35%
දිස්ත්‍රික් විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව			8%

4.1.2.දිස්ත්‍රික් ඉංජිනේරු අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ඉදිකිරීම් කටයුතු අධීක්ෂණ සංඛ්‍යාව (ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ - උඩපළාත, මැදදුම්බර, අකුරණ, හතරලියද්ද, උඩුනුවර)	2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන නොලැබුණු බැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුණි.		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අප්ලන්ඩ් මහ බංගලාව නවීකරණය කිරීම්	2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන නොලැබුණු බැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුණි.		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිල නිවාස 20ක් අලුත්වැඩියා කිරීම්	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අත්‍යවශ්‍ය අලුත්වැඩියා කිරීම්	100%		
පුහුණු වැඩසටහන් සංඛ්‍යාව (ප්‍රා.ලේ. කාර්යාල 20හි සංවර්ධන නිලධාරීන් සඳහා)	100%		
පුහුණු වැඩසටහන් සංඛ්‍යාව (ප්‍රා.ලේ. කාර්යාල 20හි තාක්ෂණ නිලධාරීන් සඳහා)	100%		

4.1.3. ගිණුම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
2022 වර්ෂයට මුල්‍ය බලතල පැවරීම	100%		
මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම 2021	100%		
2022 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම	100%		
වැටුප් ගණනය කිරීම හා Payroolපරිගණක වැඩසටහන මඟින් වැටුප් පිළියෙල කිරීම හා ගෙවීම	100%		
මාසික ඒකාබද්ධ ගිණුම් සාරාංශ පිළියෙල කිරීම	100%		
පිළියෙල කරන ලද මාසික බැංකු සැසඳුම් ප්‍රමාණය	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අක් මුදල් නිදහස් කිරීම	100%		
ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු සියලු මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීම	100%		
පිළිතුරු සපයන ලද අභ්‍යන්තර හා බාහිර විගණන විමසුම්	100%		

ප්‍රමාණය			
විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ප්‍රතිපාදන වෙන් කරනු ලබන දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ වලට ප්‍රතිපාදන සීමාව තුළ ලිපිද්‍රව්‍ය නිකුත් කිරීම හා අදාළ ලේඛන නඩත්තු කිරීම	100%		
වත්කම් සත්‍යාක්ෂණය කිරීම	100%		
ප්‍රසම්පාදන සැලැස්ම	50%	රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වසරේ මුල් කාර්තුව තුළදී මිලදී ගැනීම් සිදු නොවුණි	
ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිලි ඉදිකිරීම	ප්‍රතිපාදන නොලැබුණි.		
ස්ථාන මාරු වී ගිය සහ පැමිණි නිලධාරීන් ගේ ණය ශේෂ නිරවුල් කිරීම හා ගිණුම් ගත කිරීම	100%		
ආදායම් රැස් කිරීමේ කටයුතු	100%		
ප්‍රතිපාදන කළමනාකරණය	100%		
පොදු තැන්පත් ගිණුමේ කටයුතු	100%		
වවුචර්පත් පරීක්ෂා කිරීමේ කටයුතු	100%		
සරප්ගේ රාජකාරී කටයුතු	100%		
අග්‍රිම පාලන කටයුතු	100%		
භාණ්ඩ මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු	100%		
විශ්‍රාම වැටුප් පිළිබඳ කටයුතු	100%		

4.1.4.අභ්‍යන්තර විගණන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ පාලන ආයතන වල විගණන ක්‍රියාකාරකම්			
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / විවිධ දෙපාර්තමේන්තු අමාත්‍යාංශ	100%		
උඩපළාත ප්‍රා.ලේ කාර්යාලය	100%		
පස්බාගේ කෝරළේ ප්‍රා.ලේ කාර්යාලය	100%		
පූජාපිටිය ප්‍රා.ලේ කාර්යාලය	100%		
මැදඋම්බර ප්‍රා.ලේ කාර්යාලය	100%		
උඩඋම්බර ප්‍රා.ලේ කාර්යාලය	100%		
පාතහේවාහැට ප්‍රා.ලේ කාර්යාලය	100%		
හාරිස්පත්තුව ප්‍රා.ලේ කාර්යාලය	100%		
ගඟවටකෝරළේ ප්‍රා.ලේ කාර්යාලය	100%		
තුම්පනේ ප්‍රා.ලේ කාර්යාලය	100%		
යටිනුවර ප්‍රා.ලේ කාර්යාලය	100%		
අකුරණ ප්‍රා.ලේ කාර්යාලය	100%		
උඩුනුවර ප්‍රා.ලේ කාර්යාලය	100%		
හතරලියද්ද ප්‍රා.ලේ කාර්යාලය	100%		
මිණිපේ ප්‍රා.ලේ කාර්යාලය	100%		
ගඟ ඉහළ කෝරළේ ප්‍රා.ලේ කාර්යාලය	100%		
කුණ්ඩසාලේ ප්‍රා.ලේ කාර්යාලය	100%		
පාතදුම්බර ප්‍රා.ලේ කාර්යාලය	100%		
පන්විල ප්‍රා.ලේ කාර්යාලය	100%		
දොළුව ප්‍රා.ලේ කාර්යාලය	100%		

දෙල්තොට ප්‍රා.ලේ කාර්යාලය	100%		

4.1.5. සංවර්ධන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ මගපෙන්වීම් වලට අනුව සේවාරම්භක පුහුණුව සඳහා ආයතන වලට යොමු කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන්සංඛ්‍යාව	99%		
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයයේ ප්‍රතිපාදන යටතේ කළමනාකරණ නොවන සේවා ගණයේ පුහුණු වැඩසටහන්	100%		
කළමනාකරණ සේවා නිලධාරි සඳහා පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	100%		
ප්‍රායෝගික පුහුණුව සඳහා අනුයුක්ත කරන ලද ආධුනික පුහුණුලාභීන් සංඛ්‍යාව	100%		
විභාග කරන ලද පෙත්සම් හා පැමිණිලි සංඛ්‍යාව	98%		
අඩු අදායම්ලාභී පවුල්වල 100000 ක් රැකියාගත කිරීමේ වැඩසටහන යටතේ කාර්යාලගතව පුහුණු කිරීමට යොමු කරන ලද රැකියාලාභීන් සංඛ්‍යාව	99%		
බලශක්ති සංරක්ෂණ ප්‍රගති නිර්ණය කිරීම සම්බන්ධයෙන් සකස් කරන ලද ප්‍රගති වාර්තා සංඛ්‍යාව	100%		
වන අලි වන්දි ගෙවන ලද වින්දිතයින් සංඛ්‍යාව	94%	පෙර වර්ෂ වල ඉලක්කයන්ට සාපේක්ෂව වන්දි ඉල්ලුම් පත්‍ර 50 ක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කළ ද ලැබුණු ඉල්ලුම් පත්‍ර ප්‍රමාණය 47 කි.	
තොරතුරු දැන ගැනීමේ පනතට අනුව ලැබෙන ඉල්ලීම්	100%		
වාර්ෂික අබිං කම්ටුවසහ නිකුත් කරන ලද අබිං බලපත්‍ර සංඛ්‍යාව	100%		
ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් සහ ජාතික උත්සව සංඛ්‍යාව	100%		
සංචාරක නිවාස වෙන්කිරීම් සංඛ්‍යාව	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රාජ්‍ය ආයතන, බැංකු හා පෞද්ගලික අංශ සම්බන්ධ කරගනිමින් මහජනතාව වෙත අවශ්‍ය සේවාවන් සැපයීම යටතේ ලැබුණු ඉන්ධන ඉල්ලීම් සංඛ්‍යාව		80%	
පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ අධීක්ෂණට යටත් වනදිස්ත්‍රික් ලේකම් කාර්යාල ඇගයීම් සම්බන්ධ නිර්ණායකයන්ට අදාළව මහජන සේවා සැපයීම පිළිබඳ සකස් කරන ලද ප්‍රගති වාර්තා සංඛ්‍යාව	100%		
සකස් කරන ලද වාර්ෂික කාර්ය සාධන වාර්තා සංඛ්‍යාව	100%		

4.1.6. ඉඩම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
මහජනතාවවිසින් යොමු කර ඇති ඉඩම් සම්බන්ධ පැමිණිලි	106%		
විවිධ ආයතන විසින් යොමු කර ඇති ඉඩම් සම්බන්ධ පැමිණිලි		88%	
ඉඩම්නඩු	අධිකරණයේ ක්‍රියාකාරී මට්ටමේ පවතින නඩු 20ක් පවතින අතර සියළු නඩු සඳහා කැඳවීම්		18%

	නොකරන බැවින් සහභාගි වන නඩු වාර ගණන අනුව ප්‍රගතිය සටහන් කර ඇත.		
පරිසර කමිටු හා ඉඩම් කටයුතු පිළිබඳ කමිටු			62%
දෛනිකතැපෑල	100%		
ඉඩම්කටයුතු -ඉඩම් අත්පත්	100%		
දැවහෙලීම්	185%		
ජල විදුලි කටයුතු		80%	
යටිතල පහසුකම්	215%		
නිලනිවාස සම්බන්ධ කටයුතු	100%		
නිල නිවාසඅළුත්වැඩියා කිරීම්	100%		
ගිනිඅවි සම්බන්ධ රාජකාරි	99%		

4.1.7. ජන හා සංඛ්‍යා ලේඛණ අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
ශ්‍රීලංකාවේශ්‍රමබලසමීක්ෂණය-2022- සමීක්ෂණය	100%		
කාණ්ඩ 1 ඒ (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම්- සතිපතා)	100%		
කාණ්ඩ 1 (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම් - සති දෙක වරක්)	100%		
කාණ්ඩ 11 (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම්- මසකට වරක්)	100%		
නිෂ්පාදකයාගේමිලරැස්කිරීම් - (මසකට වරක්)LPAP	100%		
(විවෘත වෙළඳපොලමිල රැස්කිරීම්- කාර්තුවකට වරක්)ICP	100%		
කාණ්ඩ 111 (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම්- කාර්තුවකට වරක්)	100%		
වීඅස්වනු සමීක්ෂණය	100%		
වීවගාකළ බිම් ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම හා සකස් කරන ලද දිස්ත්‍රික්වාර්තා	100%		
ගොඩ හෝගපිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීමහාසකස් කරන ලද දිස්ත්‍රික්වාර්තා	100%		
මස්පිණිස මරනු ලබන සතුන් පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම්	100%		
ගොඩනැගිලිසංඛ්‍යාලේඛන එක්රැස්කිරීම්	100%		
පලාත්පාලන සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම්	100%		
වාර්ෂිකඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය	100%		
දැවසංඛ්‍යාලේඛන රැස් කිරීම්	100%		
සංඛ්‍යා ලේඛන නිබන්ධනය සකස් කිරීම-2021	100%		
වාර්ෂිකකර්මාන්ත සමීක්ෂණය	100%		
2022ජනහා නිවාස සංගණනය	100%		
ගවකුකුළු ආදි සතුන් පිලිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම	100%		
කාලීනවදෙපාර්තමේන්තුව මගින් පවරනු ලබන විවිධ සංගණන හා සමීක්ෂණ සංඛ්‍යාව	100%		

4.1.8.දිස්ත්‍රික් ආපදා කළමනාකරණ අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සංඛ්‍යාව			67%
ආපදා කළමනාකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්		79%	
ආපදා පෙර සූදානම් සහ සැළසුම් සකස් කිරීමේ වැඩසටහන්	ග්‍රාමීය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් 49 සෑම වර්ෂයකම ඉලක්ක කළ ද 2022 වසරේ වැඩසටහන් 6 කට පමණක් ප්‍රතිපාදන ලැබූ බැවින් ඉතිරි වැඩසටහන් ක්‍රියාත්මක නොවිණි.		12%
හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ කටයුතු	112%		
පරීක්ෂා කරන ලද සහ අදාල ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කරන ලද මහජන පැමිණිලි සංඛ්‍යාව	පෙර වර්ෂ වල ලැබුණු ආපදා සම්බන්ධ මහජන පැමිණිලි හා කාලගුණ තත්ත්වය මත පැමිණිලි 800 ක් පමණ ලැබෙනු ඇතැයි අපේක්ෂා කළද ලැබූ පැමිණිලි සංඛ්‍යාව 220 කි.		28%
ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට යොමු කල භූ පරීක්ෂණ වාර්තා	ලැබුණ මහජන පැමිණිලි 220 න් 210 ක් සඳහා මෙම ආයතනය සමග සම්බන්ධීකරණය කරමින් භූ පරීක්ෂණ වාර්තා ලබා දී ඇති අතර ඒ අනුව ප්‍රගතිය 95% කි. නමුත් ඉලක්කය පැමිණිලි 800 ක් ලෙස යොදාගත් බැවින් ප්‍රගතිය අඩුකර පෙන්වයි.		26%

4.1.9. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලැසුම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම, යාවත්කාලීන කිරීම, දත්ත භූවමාරුව සහ ඉඩම් පරිහරණ සැලසුම්කරණය	100%		
ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ සමීක්ෂණය	100%		
සහභාගිත්ව ප්‍රවේශය තුළින් ක්ෂුද්‍ර ජල පෝෂක මට්ටමින් සකස් කරන ලද ඉඩම් පරිහරණ සැලසුම්	100%		
දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු සංඛ්‍යාව	100%		
ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු සංඛ්‍යාව	100%		
යාවත්කාලීන කරන ලද ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම්	100%		

4.1.10. ආගමික කටයුතු අංශය (බෞද්ධ කටයුතු)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
වැඩිදියුණු කරන ලද ඌණ සංවර්ධිත විහාරස්ථාන සංඛ්‍යාව	භාණ්ඩාගාර ලේකම්ගේජාතික අයවැය චක්‍රලේඛඅංක 03/2022 හා 2022.04.26 දිනැතිරාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛයට අනුව සියළු සංවර්ධන කාර්යයන්අත්හිටුවීම.		35%
වැඩිදියුණු කරන ලද ඌණ සංවර්ධිත දහම් පාසල් සංඛ්‍යාව			
අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් විපතට පත් වූ විහාරස්ථාන සංවර්ධනය කිරිම් සංඛ්‍යාව			60%
පුණ්‍යග්‍රාම සංවර්ධන වැඩසටහන්			33%
ආගමික සුරක්ෂිතතාවය (ඉටු කරන ලද අක්ත පත්‍ර ප්‍රදාන සහ ආදාහන උත්සව)			70%
ආගමික, අධ්‍යාපන,සුරක්ෂිත, ප්‍රවර්ධනය හා පෝෂණය පිළිබඳ වැඩසටහන්			80%
ආහාර සුරක්ෂිතතා වැඩසටහන්	100%	වර්ෂය මුල දී ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් නොවූ නමුත් අවසන් කාර්තුවේ දී ක්‍රියාත්මක කරන ලදී.	
අන්තර් ආගමික සහජීවන වැඩසටහන්	100%		
මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්	100%		

4.1.11. ආගමික කටයුතු අංශය (හින්දු ආගමික)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ප්‍රතිසංස්කරණය, අළුත්වැඩියාව හා සංවර්ධනය කරන ලද ඌණ සංවර්ධිත හින්දු කෝවිල්	භාණ්ඩාගාර ලේකම්ගේජාතික අයවැය චක්‍රලේඛඅංක 03/2022 හා 2022.04.26 දිනැතිරාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛයට අනුව සියළු සංවර්ධන කාර්යයන්අත්හිටුවීම.		9%
ඌණ සංවර්ධිත හින්දු දහම් පාසැල් සඳහා උපකරණ ලබා දීමේ වැඩසටහන්			නැත
හින්දු උත්සව සංඛ්‍යාව	100%		
දහම් පාසල් ගුරුවරුන් සඳහා දහම් අධ්‍යාපන වැඩසටහන්	100%		
තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන්	100%		
දීමනා ලබා දුන් දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව	100%		
සකස් කරන ලද දත්ත තොරතුරු පද්ධතිය	100%		
ආහාර සුරක්ෂිතතා වැඩසටහන්	100%		
අන්තර් ආගමික සහජීවන වැඩසටහන්	100%		
මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්	100%		

4.1.12. ආගමික කටයුතු අංශය (ක්‍රිස්තියානි ආගමික)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ප්‍රතිසංස්කරණය, අළුත්වැඩියාව, හා සංවර්ධනය කරන ලද දේවස්ථාන සංඛ්‍යාව	භාණ්ඩාගාර ලේකම්ගේජාතික අයවැය චක්‍රලේඛඅංක 03/2022 හා 2022.04.26 දිනැතිරාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛයට අනුව සියළු සංවර්ධන කාර්යයන්අත්හිටුවීම.		
ඌණ සංවර්ධිත දහම් පාසැල් සඳහා උපකරණ ලබා දීමේ වැඩසටහන්	100%		
ගැටළුකාරී හා අනවසර ආගමික ස්ථාන සම්බන්ධව ක්‍රියා කිරීම් සංඛ්‍යාව	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දහම් පාසල් දරුවන් සඳහා කාණ්ඩ 03ක් යටතේ පවත්වන ලද දහම් පාසල් රචනා දැනුම මිනුම් තරග	100%		
අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් (තරුණ, පවුල්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්)	100%		
දහම් අධ්‍යාපන වැඩසටහන් (දහම් පාසල් ගුරුවරුන් සඳහා දහම් අධ්‍යාපන වැඩසටහන්, ස්වේච්ඡා දහම් පාසල් ගුරුවරුන් ඇගයීමේ වැඩසටහන්, අ.පො.ස. උ/පෙළ විභාග සම්මන්ත්‍රණ, දහම් පාසල් පුස්තකාල පොත් කට්ටල ලබා දීම)	100%		
ආහාර සුරක්ෂිතතා වැඩසටහන් (ආගමික ස්ථාන)	100%		
අන්තර් ආගමික සහජීවන වැඩසටහන් (නත්තල්)	100%		
දීමනා ලබා දුන් දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව	100%		
දත්ත තොරතුරු පද්ධති යාවත්කාලීන කිරීම	100%		

4.1.13. ආගමික කටයුතු අංශය (මුස්ලිම් ආගමික)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දහම් පාසැල් සඳහා ආධාර, වැඩි දියුණු කිරීම්, අළුත්වැඩියා කටයුතු සහඋපකරණ ලබා දීම් සිදු කරන ලද මුස්ලිම් ආගමික පල්ලි සංඛ්‍යාව	භාණ්ඩාගාර ලේකම්ගේජාතික අයවැය චක්‍රලේඛඅංක 03/2022 හා 2022.04.26 දිනැතිරාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛයට අනුව සියළු සංවර්ධන කාර්යයන්අත්හිටුවීම.		6%
මුස්ලිම් ආගමික උත්සව සංඛ්‍යාව (උදා-මීලාන් නබි,රාමසාන්)	100%		
මුස්ලිම් දහම් පාසැල් ගුරුවරුන් සඳහා ගුරු පුහුණු වැඩසටහන්	100%		
ගුරු දීමනා ලබා දුන් මුස්ලිම් දහම් පාසැල් ගුරුවරුන් සංඛ්‍යාව	100%		
මුස්ලිම් කලාකරුවන් සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	100%		
මුස්ලිම් තරුණ තරුණියන් සඳහා පවත්වන ලද මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සංඛ්‍යාව	100%		
ආහාර සුරක්ෂිතතා වැඩසටහන්	100%		
අන්තර් ආගමික සහජීවන වැඩසටහන්	100%		
මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්	100%		

4.1.14. සංස්කෘතික කටයුතු අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
සර්ව ආගමික වැඩසටහන් සංඛ්‍යාව	100%		
ලියාපදිංචි කරන ලද සෞන්දර්ය ළමා සමාජ සංඛ්‍යාව	100%		
ජන ක්‍රීඩා හඳුනා ගැනීමේ වැඩසටහන්	100%		
සංස්කෘතික දරුවෙකු නිර්මාණය කිරීමේ වැඩසටහන්	100%		
දිස්ත්‍රික් ජාතික නිදහස් දින සැමරුම් උත්සවය	100%		
නිදහසේ අරුණැල්ල වැඩසටහන	100%		
දිස්ත්‍රික් සංස්කෘතික සිතියම නිර්මාණය සඳහා ප්‍රා.ලේ සිතියම් රැස්කිරීම	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
තත්බිදිනද රාජ්‍ය සංගීත කණ්ඩායම් ප්‍රසංගය	දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන වැඩසටහනක් වූ මෙයට ප්‍රතිපාදන නොලැබුණු බැවින් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.		
බක්මහ උළෙල හා ජන ක්‍රීඩා මංගල්‍යය	රටේ පැවති අරලගලකාරි තත්වය හේතුවෙන් මහජනයා ඒකරාශි කිරීමට නොහැකි වූ බැවින් ලැබුණු උපදෙස් මත වැඩසටහන ක්‍රියාත්මක නොවිණි.		
“කෙතයි බතයි අපේකමයි” දේශීය ආහාර සංස්කෘතික වැඩසටහන	100%		
සංහිඳක සවිය සාහිත්‍ය උත්සවය	100%		
අගහිඟ කලාකරු ආධාර ගෙවීම් සංඛ්‍යාව	100%		
කලායතන ආධාර ගෙවීම් සංඛ්‍යාව	100%		
රාජ්‍ය කලාභූෂණ සම්මාන ප්‍රදානය	100%		
ආහාර සැකසුම් ක්‍රමවේද ජනගත කිරීමේ වැඩසටහන්	100%		
වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යය	100%		
කෙටි චිත්‍රපට උළෙල	100%		
ලෝක කවි දින සම්මේලනය	100%		

4.1.15. ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ත්‍රෛ භාෂා නාමපුවරු සකස් කරන ලද කාර්යාල සංඛ්‍යාව		75%	
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව කාර්යාලයීය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	100%		
සේවාලාභියා හා නිලධාරියා අතර සංවාදයේ යෙදීමට සකස් කරන ලද කෙටි වාක්‍ය සංඛ්‍යාව	100%		
භාෂා සැලසුම් සකස් කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලසංඛ්‍යාව			50%
මහනුවර දිස්ත්‍රික්කයේආදර්ශ කාර්යාල ලෙස සංවර්ධනය කරන ලද රජයේ කාර්යාල සංඛ්‍යාව	100%		
පැය 100 දෙමළ භාෂා පාඨමාලාව සඳහා සහභාගි වූ සංඛ්‍යාව	ගුරුවරුන් ගේ ගෙවීම් සඳහා ප්‍රතිපාදන නොලැබූ බැවින් පුහුණු වැඩසටහන් සියල්ලම ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.		40%
පැය 150 දෙමළ භාෂා පාඨමාලාව සඳහා සහභාගි වූ සංඛ්‍යාව	100%		
පැය 200 දෙමළ භාෂා පාඨමාලාව සඳහා සහභාගි වූ සංඛ්‍යාව		82%	
පැය 100 හා 150 සිංහල භාෂා පාඨමාලාව සඳහා සහභාගි වූ සංඛ්‍යාව	ගුරුවරුන්ගේ ගෙවීම් සඳහා ප්‍රතිපාදන නොලැබූ බැවින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.		
දිස්ත්‍රික් අන්තර් ආගමික සහජීවන කමිටුව පවත්වාගෙන යාම	අමාත්‍යාංශ විෂය පථය මාරු වී ඇති බැවින් සංවර්ධන නිලධාරි (ජා.ඒ.) වෙත භාර දෙන ලදී.		

4.1.16. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්			63%
නිෂ්පාදන සංවර්ධන වැඩසටහන්	123%		
අලෙවි සංවර්ධන වැඩසටහන්		89%	
මූල්‍ය සංවර්ධන වැඩසටහන්	ප්‍රතිපාදන නොලැබීම නිසා මෙම වැඩසටහන ක්‍රියාත්මක නොවිණි.		41%
ව්‍යාපාර උපදේෂණ වැඩසටහන්	ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම, පැවති අර්බුදකාරී තත්වය හමුවේ රජයේ නිවාඩු කාලසීමා ප්‍රකාශ කිරීම හේතු මත වැඩසටන් 36න් ක්‍රියාත්මක වූයේ 13ක් පමණි. නමුත් සංවර්ධන නිලධාරීන් සහ මාර්ග ගත ක්‍රමවේද මගින් උපදේශණ කටයුතු සිදු කර ඇත.		36%
පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්			41%

4.1.17. මිණුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දිස්ත්‍රික්කය පුරා වෙළඳ ප්‍රජාවගේ කිරුම් මිනුම් උපකරණ සත්‍යෝක්ෂණය කොට මුද්‍රා තැබීමෙන් රජයට ලබාගත් ආදායම් ප්‍රමාණය	92%		
වෙළඳාමේදී සිදුකරන අක්‍රමිකතා සොයාබලා අධිකරණයට ඉදිරිපත් කල ප්‍රමාණය	100%		
කිරුම් මිනුම් කටයුතු පිළිබඳ මහජනයා දැනුමක් කිරීමේ වැඩසටහන්	100%		

4.1.18. පාරිභෝගික සේවා අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දැනුවත් කිරීම්			73%
මිල සමීක්ෂණ	231%		
පාරිභෝගික පැමිණිලි		84%	
වෙළඳපොළ වැටලීම්	ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාද වීම, ඉන්ධන මිල අධික ලෙස වැඩිවීම හේතුවෙන් ලබා දුන් ප්‍රතිපාදන මත ලබා ගත හැකි ඉන්ධන ලීටර් ප්‍රමාණය අවම වීම, කොරෝනා තත්වය වර්ෂයේ මුල පැවතීම හේතුවෙන් සේවා මුර ක්‍රමයට නිලධාරීන් කැඳවීම සහ කාර්යාලයේ බහුතරනිලධාරී පිරිසකට		26%

	කොරෝනා වැළඳීම යන හේතූන් මත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.	

4.1.19. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ආදායම් උත්පාදනය සඳහා පෙලඹවීමේ දෙදින පුහුණු වැඩසටහන්	100%		
සවිබල ගන්වන ලද විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් සංඛ්‍යාව	100%		
සවිබල ගන්වන ලද වතු කාන්තාවන් සංඛ්‍යාව	100 %		
සවිබල ගන්වන ලද ස්වාමියා බන්ධනාගාරගත වූ පවුල් සංඛ්‍යාව	100%		
ආර්ථික වශයෙන් ශක්තිමත් කරන ලද වැන්දඹු කාන්තාවන් සංඛ්‍යාව	100%		
ජංගම අලෙවිකුටි ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	100%		
වක්‍රීය ණය ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	100%		
වක්‍රීය ණය සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව	95%		
ප්‍රාදේශිය කාන්තා බලමණ්ඩලය ශක්තිමත් කිරීම වෙනුවෙන් පවත්වන ලද රැස්වීම්සංඛ්‍යාව		75%	
දිස්ත්‍රික්කාන්තා බලමණ්ඩලරැස්වීම්		75%	
දේශපාලනයටකාන්තාවන්ගේ දායකත්වය පුළුල් කිරීම පිළිබඳ කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්			68%
නව තාක්ෂණිකමෙවලම් භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්	100%		
වනිතාසංවර්ධන නිලධාරින්ගේ හා ක්ෂේත්‍ර සංවර්ධන සහකාර නිලධාරින්ගේ දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම්සංඛ්‍යාව	100%		

4.1.20. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (මුල් ළමාවිය සංවර්ධන)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
‘‘උත්තම පූජා’’ ගැබිණිමවුවරුන්ගේ වැඩසටහන වෙනුවෙන් ලබා දුන් පෝෂණ මළු ගණන	97%		
උදැසන ආහාර ලබාදුන් පෙර පාසැල් දරුවන් සංඛ්‍යාව	95%		
‘‘ගුරු අභිමානී’’වැඩසටහන යටතේ මාසික දීමනාවක් ලබා දුන් පෙර පාසැල් ගුරුවරුන් සංඛ්‍යාව	96%		
පෙර පාසැල් ගුරුවරුන් සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්	98%		
ප්‍රතිසංස්කරණය කරන ලද පෙර පාසැල්සංඛ්‍යාව	100%		
ආරම්භ කරන ලද ඉගෙනුම් කව සංඛ්‍යාව	100%		
මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව ජාතික සතිය සැමරීමේ වැඩසටහන	100%		
පෙර පාසැල් සඳහා ලබාදුන් ජල පෙරණ සංඛ්‍යාව	100%		
ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව	100%		

4.1.21. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (ජාතික ළමාරක්ෂක අධිකාරිය)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තක්ෂ නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ළමා අපයෝජන සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සංඛ්‍යාව	100%		
වතු ආශ්‍රිතව දරුවන්ගේ රැකවරණය තහවුරු කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	100%		
ළමා සංවර්ධන මධ්‍යස්ථානඅධීක්ෂණය	100 %		
දින සැමරුම් වැඩසටහන්		75%	ප්‍රතිපාදන නොලැබීම
අධ්‍යාපන ආධාර ලබා දුන් අනාරක්ෂිත, වින්දිත, ආන්තික දරුවන් සංඛ්‍යාව	100%		
පාසල් ළමා ආරක්ෂක කමිටු අධීක්ෂණය	100%		
ළමා සංවර්ධන මධ්‍යස්ථාන ආශ්‍රිත මනෝ සමාජීය වැඩසටහන්		75%	ළමා සංවර්ධන මධ්‍යස්ථාන දෙකක් වසා තැබීම
ළමා ආරක්ෂාවට අදාළව අවධානම් සාධක හඳුනාගනිමින් ක්‍රියාත්මක වන ළමා ආරක්ෂක වැඩසටහන්	100%		
හදිසි ආපදා තත්වයන්හිදී ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩසටහන්	100 %		
පාසල් මාධ්‍ය සමාජ ආශ්‍රිත ළමා ආරක්ෂක වැඩසටහන්	ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් වැඩසටහන නොපැවැත්වීය		
විගමනික දරුවන්ගේ ආරක්ෂාව සඳහා ක්‍රියාත්මක ළමා ආරක්ෂක වැඩසටහන්			
මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව	100 %		
ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව	100 %		ප්‍රතිලාභීන් 21118කි.

4.1.22. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තක්ෂ නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
කැපකරු දෙගුරු අධ්‍යාපන ආධාර ලබා දුන් අඩුආදායම්ලාභී පවුල් වල ළමුන් සංඛ්‍යාව	100%		
පාසල් නොයන ළමුන් පාසල්ගත කර අධ්‍යාපන උපකරණ ලබා දුන් ළමුන් සංඛ්‍යාව	100%		
අධ්‍යාපන ආධාර ලබා දුන් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සංඛ්‍යාව (යුනිසෙෆ්)	100 %		
අධ්‍යාපන උපකරණ ලබාදුන් අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන්සංඛ්‍යාව(මැලිබන් ආයතනය)	100%		
වෛද්‍ය, පෝෂණ, නිවුන්දරු උපත් ආදී විවිධ ආධාර ලබාදුන් අවදානම් ළමුන් සංඛ්‍යාව	100%		
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ළමා සභා රැස්වීම්/ වැඩසටහන්	100%		
දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු රැස්වීම්		75%	යොදාගෙන තිබූ එක් රැස්වීමක් හදිසියේ අවලංගු කිරීමට සිදුවිම
ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු රැස්වීම්	100%		
ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්	100%		
ක්‍රියාත්මක කරන ලද අවදානම් පවුල් සඳහා ආරක්ෂණ	100%		

සැලසුම් ව්‍යාපෘති			
ලෝක ළමා දිනය වෙනුවෙන් සැමරුම් වැඩසටහන්	100%		
ආන්තීකරණය වූ ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති සංඛ්‍යාව	100%		

4.1.23. මානව සම්පත් සංවර්ධන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තක්ෂ නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
9 වසර සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	රටේ පැවති අරගලකාරී තත්වය මත පාසල් වසා තැබීම		71%
උසස් පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්			71%
සාමාන්‍ය පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්		85%	
දිස්ත්‍රික් රැකියා පොළ	100%		
දිස්ත්‍රික් වෘත්තීය පොළ	100%		
ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්	100%		
ලියාපදිංචි කරන ලදරැකියා අපේක්ෂිතයින් සංඛ්‍යාව	115%		
ලියාපදිංචි කරන ලදරැකියා ඇබෑර්තුසංඛ්‍යාව	122%		
රැකියාසඳහා යොමු කරන ලද රැකියා අපේක්ෂිතයින් සංඛ්‍යාව		89%	රටේ පැවති තත්වය මත බඳවා ගැනීම් සීමිත වීම
රැකියාගතකරන ලද රැකියා අපේක්ෂිතයින් සංඛ්‍යාව	රටේ පැවති අරගලකාරීතත්වය මත බඳවා ගැනීම් සීමිත වීම		65%
වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	114%		
වෘත්තීය පුහුණුව සඳහා යොමු කරන ලද ප්‍රතිලාභීන් ගණන	137%		
ව්‍යවසායන්/ ස්වයංරැකියා සඳහා යොමු කළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව	94%		
වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	100%	වර්ෂය මුලදී ඉලක්ක නොකලද වර්ෂ අවසානයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වේ	
ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා සංවිධානය කරන ලද සම්මුඛ පරීක්ෂණ	100%		

4.1.24. විදේශ රැකියා කටයුතු අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තක්ෂ නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
විදෙස් ගත වීමට අපේක්ෂිත තරුණ පිරිස්වල රැකියා යෝග්‍යතාවය ඉහළ නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව		85%	
ස්ත්‍රී පුරුෂ සමාජභාවය දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව		85%	
මිනිස් වෙළඳාම හා කුටණය වැලැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්	114%		
විදෙස් ගත වූවන්ගේ පවුල්වල ආර්ථික සංවර්ධනය හා දරුවන්ගේ රැකවරණය වෙනුවෙන් සකස් කරන ලද සැලසුම් සංඛ්‍යාව		90%	
සම්පත් දායකත්වය ලබා දුන් වැඩමුළු සංඛ්‍යාව	100%		
ප්‍රගති සමාලෝචන රැස්වීම්	100%		

4.1.25. ආයතන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දෛනික තැපෑල සම්බන්ධ කටයුතු	100%		
නිලධාරීන් අනුයුක්ත කිරීම	100%		
රාජකාරි පැවරීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන සම්බන්ධ සියළු කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වාහන සම්බන්ව දිස්ත්‍රික් ලේකම්තුමාට බලය පැවරූ ආයතන කටයුතු	100%		
වාහන සම්බන්ධ වෙනත් කටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඒකාබද්ධ සේවයේ මාණ්ඩලික නොවන නිලධාරීන් රියදුරන්ගේ ආයතන කටයුතු	100%		
වෙනත් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ආරක්ෂක/පිරිසිදු කිරීමේසේවයට අදාළ රාජකාරී කටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරී නොවන,ඒකාබද්ධ සේවයට අයත් සියළුම සේවාවන්ට අයත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු හාආයතන කටයුතු	100%		
ග්‍රාම නිලධාරි විනය කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කළ/ඉදිරි වැඩසටහන් නිවාඩු,නිවාඩු දිනවැටුප්,අතිරේක ඉන්ධන අනුමැතිය	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ආරක්ෂක/පිරිසිදු කිරීමේසේවයට අදාළ ගෙවීම් වවුචරය සකස් කිරීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාමර වෙන් කිරීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු ගොනුව	100%		
දිස්ත්‍රික් ලේකම් රාජකාරි දිනපොත යාවත්කාලීන කිරීම	100%		
ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කළ/ඉදිරි වැඩසටහන් නිවාඩු,නිවාඩු දිනවැටුප්,අතිරේක ඉන්ධන හා විදේශ ගමන් සම්බන්ධ රාජකාරි	100%		
දිසාපති සමුළුව සම්බන්ධ රාජකාරි	100%		
දිස්ත්‍රික් ලේකම් විසින් පවරන වෙනත් රාජකාරි	100%		
ග්‍රාම නිලධාරි ස්ථානමාරු සම්බන්ධ රාජකාරි	100%		
ග්‍රාම නිලධාරීන් දෙමළ භාෂාවෙන් නිදහස් කිරීමේ රාජකාරි	100%		
ග්‍රාම නිලධාරි උසස් කිරීම සම්බන්ධ රාජකාරි	100%		
ග්‍රාම නිලධාරි ස්ථිර කිරීම සම්බන්ධ රාජකාරි	100%		
පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම	100%		
පුපුරණ ද්‍රව්‍ය වාරික නිකුත් කිරීම	100%		
ගිනිඅවි භාර ගැනීම හා නිකුත් කිරීමේ කටයුතු	100%		
මාසික ප්‍රගති වාර්තා අමාත්‍යාංශය වෙත යැවීම	100%		
සංවර්ධන නිලධාරි පෞද්ගලික ලිපිගොනු	100%		
අනුමත කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම	100%		
මැතිවරණ කටයුතු	100%		
නිල ඇඳුම් දීමනා රාජකාරි කටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලේඛණාගාරයේකටයුතු	100%		
සියළු නිලධාරීන්ගේ අතිකාල අනුමත කිරීමට අදාළ	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ආකෘති පත්‍ර නිකුත් කිරීමට	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අග්‍රහාර රක්ෂණ ක්‍රමයට අදාළ කටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයට අදාළ රාජකාරි	100%		
දෛනිකවිද්‍යුත් තැපෑල පරීක්ෂාව හා අදාළ අංශ වෙත යොමු කිරීම	100%		
විද්‍යුත් ලිපි යැවීමේ කටයුතු	100%		
කාර්යාලීය වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම	100%		
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේකාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම	100%		
සියළුම නිලධාරීන්ගේ නිවාඩුසම්බන්ධ රාජකාරි	100%		
ඇඟිලි සළකුණු යන්ත්‍රය සම්බන්ධ කටයුතු	100%		
මාණ්ඩලික නිලධාරීන්ගේ නිවාඩු දින වැටුප් රාජකාරි	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත වෙනත් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඉදිරි හා කළ වැඩසටහන් ගොනු නඩත්තු කිරීම්	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ගේ නිවාඩු දින වැටුප් ගෙවීම් අනුමැතියට අදාළ කටයුතු	100%		
අත්තිකාරම් බී ගිණුම් යටතේ ණය ගෙවීම් සම්බන්ධ කටයුතු	100%		
ක්ෂේත්‍ර නිලධාරීන් ගමන් වියදම් වවුචර් සම්බන්ධ කටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම්	100%		
ඇප තැන්පත් කිරීම් සම්බන්ධ කටයුතු	100%		
හදිසි මරණ පරීක්ෂක සම්බන්ධ කටයුතු	100%		
රෙජිස්ට්‍රාර් අංශයේ පොදු කටයුතු	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමුළුව පැවැත්වීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු	100%		
ඵලදායිතා හා විදේශ නියෝජිත සම්බන්ධීකරණ කටයුතු	100%		
දිසාපතිතුමා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් සම්බන්ධව ලැබෙන පැමිණිලි ,ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හා අගමැති ලේකම් කාර්යාලයෙන් ලැබෙන පැමිණිලි හා වෙනත් මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු	100%		
නීති සම්බන්ධ කටයුතු	100%		
වෙනත් මහජන පැමිණිලි හා ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	100%		
අමාත්‍යාංශ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්පත් හුවමාරුව හා සන්නිවේදන ජාලය කාර්යක්ෂමව පවත්වාගෙන යාම	100%		
තොරතුරු හා මෙවලම් වැඩිදියුණු කිරීම	100%		
නිල විද්‍යුත් සන්නිවේදන පද්ධතිය පවත්වාගෙන යාම	100%		
දෛනික තැපෑල පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම	100%		
ලිපි තැපැල් කිරීමේ කටයුතු	100%		
ආයතන අංශයේ යන්ත්‍ර සූත්‍ර වලට අදාළ ගොනු කටයුතු	100%		
පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර/ බලපත්‍ර නිකුත් කිරීම	100%		
පුපුරණ ද්‍රව්‍ය වාරික නිකුත් කිරීම	100%		
පතරොම් වාරික නිකුත් කිරීම	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ගිනිඅවි භාර ගැනීම හා නිතුත් කිරීමේ කටයුතු	100%		
මාසික ප්‍රගති වාර්තා අමාත්‍යාංශය වෙත යැවීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ජල, විදුලි, දුරකථන හා පුවත්පත් බිල්පත් පියවීමට අදාළ රාජකාරි	100%		
භාෂා දීමනාව ගෙවීමට අදාළ රාජකාරි	100%		
දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමට අදාළ රාජකාරි	100%		
නිවාස හා නිවාස කුලී අය කිරීමට අදාළ රාජකාරි	100%		
වරිපනම් බදු ගෙවීමට අදාළ අදාළ රාජකාරි හා ආයතන අංශයේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත සියළුම සංවර්ධන නිලධාරීගේ සේවය ස්ථිර කිරීම, අනුයුක්ත කිරීම, ස්ථා මාරු කිරීම්, උසස් කිරීමේ කටයුතු හා විනය කටයුතු සම්බන්ධ රාජකාරි	100%		

4.1.26. ඵලදායිතා අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
අධ්‍යාපන අංශය	102%		
රාජ්‍ය අංශයේ ඵලදායිතා ප්‍රවර්ධනය		85%	
නිෂ්පාදන හා සේවා	114%		
මධ්‍යම/සුළු පරිමාණ ව්‍යාවසාය සංවර්ධන වැඩසටහන	120%		
සම්පත් දායකත්වය ලබාදීම.	100%		
ප්‍රගති සමාලෝචනය		83%	
2020ජාතික ඵලදායිතා සම්මාන සඳහා සුදුසුකම් ලද හා නොලද ආයතන අධීක්ෂණය හා ජයග්‍රහණය කරා මෙහෙයවීම			52%

4.1.27. දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100%-90%	75% - 89%	50% - 74%
රජයේ සංවර්ධන කාර්ය භාරය පිළිබඳ මහජනතාව දැණුවත් කිරීම සඳහා සම්පූර්ණ කරන ලද ප්‍රවෘත්ති නිවේදන ගණන	100%		
මහජන සහ රජයේ අවධානය යොමු විය යුතු තොරතුරු සම්බන්ධයෙන් අදාල පාර්ශව දැණුවත් කිරීම සඳහා සම්පූර්ණ කරන ලද විශේෂාංග වීඩියෝ ගණන	100%		
රජයේ සංවර්ධන කාර්ය භාරය පිළිබඳ මහජනතාව දැණුවත් කිරීම සඳහා වීඩියෝ ගත කරන ලද සම්පූර්ණ ප්‍රවෘත්ති ගණන	100%		
සංවර්ධන වැඩසටහන් පිලිබඳ තොරතුරු ලබාගැනීම සහ ප්‍රධාන කාර්යාලය දැණුවත් කිරීම සඳහා ආවරණය කරන ලදසංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව	100%		
ප්‍රවෘත්ති දෙපා. මගින් දිස්ත්‍රික් මට්ටමින් පවත්වාගෙන යන Facabook ගිණුම යාවත්කාලීන කිරීම් ගණන	100%		
දිස්ත්‍රික්කයට අදාලව පුවත්පත් වල පලවන ප්‍රවෘත්ති විමර්ශනය කොට අවශ්‍ය අවස්ථාවලදී දිසාපති/රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකගේ අවදානයට අවධානය යොමු කිරීම සඳහා දිස්ත්‍රික්කය පිළිබඳ පලවන වැදගත් ප්‍රවෘත්ති එකතුවක් පවත්වා ගැනීම	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තක්ෂ නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
නිවැරදි මාධ්‍ය භාවිතය පිලිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීම සඳහා පැවැත් වූ පාසල් වැඩමුළු ගණන	100%		
ප්‍රාදේශීය මාධ්‍යකරුවන් සවිබල ගැන්වීම සඳහා පැවැත් වූ ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළු ගණන	100%		
දිස්ත්‍රික්කයේ මාධ්‍යවේදීන්ගේ දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමසඳහා පරිගණකයේ ගබඩා කර ගත් දත්ත සංඛ්‍යාව	100%		
වැදගත් ඡායාරූප සහ වීඩියෝ එකතුවත් පවත්වා ගෙන යාම සඳහා පරිගණකයේ ගබඩා කරගත් දත්ත සංඛ්‍යාව	100%		
රජයේ සංවර්ධන කාර්ය භාරය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය වාරිකා සංවිධානය කිරීම	100%		
